වාර්ෂික වාර්තාව
2018

පටුන

1. වඩා යහපත් හෙට දිනක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම 5
   - දැක්ම 6
   - මෙහෙවර 6
   - උපාය මාර්ගික ඉලක්ක 6
   - ප්‍රධාන කාර්යයන් 6
   - අපේ හර පද්ධතීන් 6
   - උපාය මාර්ගික ඉලක්කය 6
   - 1.1 පාලක සභා සභාපතිවරයාගේ පණිවිඩය 7
   - 1.2 අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය 8

2. මූල්‍ය අංශයෙහි කැපී පෙනුන අවස්ථා 9

3. පාලක සභාවෙහි සාමාජිකයන් 12

4. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය 14
   - 4.1 සේවා පහසුකම් සපයන්නන්ගේ තොරතුරු 17

5. කාර්ය සහ සංවිධාන ව්‍යුහය 19
   - 5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය ව්‍යුහය 19
   - 5.2 ශ්‍රී ලං සං පරි ආයතනයේ සංවිධාන ව්‍යුහය 20

06. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය 21
   - 6.1 සේවාරම්භක පුහුණු පාඨමාලා 21
   - 6.2 දීප ව්‍යාප්ත සේවාවන් සඳහා වන අනිවාර්ය ඉගෙනුම් සහ සංවර්ධන පුහුණු වැඩ සටහන් 22
   - 6.3 ඩිප්ලෝමා වැඩසටහන් 23
   - 6.4 කෙටිකාලීන ඉගෙනුම් සහ සංවර්ධන වැඩ සටහන් 23
   - 6.5 අභිරුචිකරණ ඉගෙනුම් සහ සංවර්ධන වැඩ සටහන් 24
   - 6.6 කළමනාකරණ උපදේශනය 27
   - 6.7 විදේශ පුහුණු ආයතනයන්හී සිටිනා නිලධාරීන් උදෙසා සම්බන්ධීකරණය කෙරෙන විදේශ අභිරුචිකරණ පුහුණු වැඩ සහටන් 27
   - 6.8 ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ 27
   - 6.9 අනෙකුත් මූලාරම්භයන් 28

07. පශ්චාත් උපාධි අධ්‍යයන පාසල 32

08. 2018 වසර තුළ පවත්වන ලද විභාග 34

09. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය 40

10. භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය 44

11. පොදු පරිපාලනය 45
   - 11.1 මානව සම්පත් කළමනාකරණය 45
   - 11.2 කාර්ය සම්පාදන කළමනාකරණය 46

12. 2018 වසරේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විශේෂ අවස්ථා 47

13. විගණන කමිටුවේ වාර්තාව 57

01. වඩා යහපත් හෙට දිනක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම

රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය යටතේ සංස්ථාපිත ආයතනයක් වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (ශ්‍රීලංසංපරිආ) 1982 අංක 9 දරණ පණතින් ස්ථාපිත කෙරිණි. එය රාජ්‍ය අංශයෙහි විධායක මට්ටමේ නිලධාරීන්ගේ වෘත්තීමය සංවර්ධනය සහ ප්‍රවීණතා වර්ධනය පිළිබඳ වගකීම පවරන ලද්දාවූ ප්‍රමුඛ ජාතික ආයතනය වේ.

පොදු යහපත උදෙසා වන හරයාත්මක වටිනාකම තුල ගත් කළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ප්‍රධානම ක්‍රියාකාරීත්ව ප්‍රදේශයන් වනුයේ රාජ්‍ය අංශයෙහි නිලධාරීන් හට පුහුණුව සැලසීම, රාජ්‍ය අංශයෙහි සංවිධාන වෙත කළමනාකරණ උපදේශනයන් සැපයීම, සහ රාජ්‍ය නිලධාරීන් පර්යේෂණයන් සඳහා දිරිගැන්වීමය.

තවද ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම පශ්චාත් මට්ටමේ උපාධි පිරිනැමීමේ අයිතිය ද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පිරිනමා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පශ්චාත් උපාධි ආයතනය මගින් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය මෙන්ම රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද පිරිනමයි. මෙය අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් මෙන්ම අනෙක් පාර්ශවකරුවන් ද එකසේ ස්වකීය කළමනාකරුවන්ගෙන් වටිනාකම් එකතු කළ දායකත්වයක් ඉල්ලා සිටින තත්වයක් යටතේ වර්තමානයෙහි සීඝ්‍රයෙන් වෙනස්වන එමෙන්ම අභියෝගාත්මක වන රාජ්‍ය කළමනාකරණ පරිසරයෙහි අවශ්‍යතාවන් සපුරාලීමේ අරමුණ පෙරදැරිවය.

රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා ගේ සමස්ත මගපෙන්වීම යටතේ ආයතනයෙහි ප්‍රතිපත්ති තීරණය කිරීමෙහිලා වන වගකීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයකනය විසින් දරනු ලබයි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පුහුණුව සහ පර්යේෂණ සඳහා සහය දක්වන ලන්ඩන් සිවිල් සේවා විද්‍යායතනය, සිංගප්පූරු සිවිල් සේවා විද්‍යායතනය, චීනයෙහි බීජිං විදෙස් අධ්‍යයන කරුසවිය, ඉන්දියාවෙහි පරිපාලනය පිළිබඳ ලාල් බහදූර් ශාස්ත්‍රී ජාතික ඇකඩමිය, ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවිය, මාලදිවයින්හී සිවිල් සේවා පුහුණු ආයතනය, චීනයෙහි හුවාසොන්ග් විද්‍යා සහ තාක්ෂණ සරසවිය වැනි විදෙස් සරසවි සහ පුහුණු ආයතනයන් කිහිපයක් සමග ජාලගතව කටයුතු කරයි. 2018 වරස තුළදී ද්වීපාර්ශවික පුහුණු සහ පර්යේෂණ සහයෝගීතාවන් පවත්වාගැනීම උදෙසා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පහත සඳහන් ආයතන සමගින් අවබෝධතා ගිවිසුමකට ඇතුලත් විණි.

- පකිස්ථාන ඉස්ලාමික ජනරජයෙහි රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ජාතික විද්‍යායතනය
- ඉන්දියාවෙහි හයිද්‍රාබාද්හී රාජ්‍ය ව්‍යවසායකත්ව ආයතනය

ගෙවී ගිය වසර 36ක කාල පරිච්ඡේදය තුළ දැනුම් වර්ධනය, කුසලතා වර්ධනය, සහ සංවිධානමය සංවර්ධනය සහ පර්යේෂණ පැවැත්වීම යන අංශයන් ඇතුළුව විස්තීර්ණ වූ පරාසයක් තුළ සේවා සම්පාදනයෙහි නිරත වෙමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය සේවයේ ප්‍රමුඛතම පුහුණු ආයතනයක් බවට පරිවර්තනය වී තිබේ.

දැක්ම

රාජ්‍ය අංශයේ ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාවලියෙහි ආසියාවේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීම.

මෙහෙවර

ඉගෙනුම හා සංවර්ධනය, උපදේශන සේවා සහ පර්යේෂණ මගින් නිර්මාණශීලි අනාගත දැක්මක් හා පුරවැසි කේන්ද්‍රගත රාජ්‍ය සේවාවක් සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීම

උපාය මාර්ගික ඉලක්ක

- වඩාත් ක්‍රියාශීලි හා ඵලදායී රාජ්‍ය සේවාවක් නිර්මාණය කිරීමේ ජාතික සංවර්ධන පරමාර්ථයට දායක වීම.
- ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සංවර්ධනයට දායකත්වය සැපයීමේ ප්‍රධාන හවුල් කරුවකුවීම.
- සංවර්ධන පරිපාලන ආයතන පිළිබඳව එහි පාර්ශවකරුවන් අතර ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැංවීමත් එතුළින් එහි ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා ඉල්ලුම ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දකුණු හා ගිණිකොණ දිග ආසියාවේ රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණ සංවර්ධන කළමනාකරණය පිළිබඳ සහයෝගිතා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය අංශයේ කළමනාකාර නිලධාරීන්ගේ ධාරිතාවය ගොඩනැංවීම සඳහා ඉගෙනුම් ක්‍රියාවලිය හා වැඩසටහන් සැකසීම.
- පශ්චාත් උපාධි වැඩසටහන් මගින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ අරමුණු සහගත පර්යේෂණ තැන්පතුවක් පවත්වාගෙන යාම.
- රාජ්‍ය අංශයේ ආයතන හා රජය සතු ව්‍යවසායන්හි ඵලදායීතාව හා කාර්යක්ෂමතාව නංවාලීම සඳහා සංවිධාන සංවර්ධන සේවාවන් පැවැත්වීම.
- රාජ්‍ය සේවය සඳහා කාර්යක්ෂමතා කඩඉම් හා භාෂා පරීක්ෂණ පැවැත්වීම.

අපගේ සාරධර්ම

- විශිෂ්ටත්වය, කැපවීම, අසමානතාව, වගවීම, තිරසාරභාවය

උපායමාර්ගික අභිලාෂය

- "වඩා හොඳ අනාගත ශ්‍රී ලංකාවක් සඳහා රාජ්‍ය අංශය බලගැන්වීම."

1.1 රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙහි ලේකම් සහ ශ්‍රී ලං සං පරි ආයතනයෙහි පාලක සභාවෙහි සභාපතිවරයාගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි 2018 වසර උදෙසා වන වාර්ෂික වාර්තාවට මෙවන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම අතිශය සතුටට පත්වෙමි. රාජ්‍ය අංශයෙහි කළමනාකරණ මට්ටමෙහි ඉන්නා නිලධාරීන්ගේ පුහුණුව පිණිස වන ඉහලම ආයතනය වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය කැපී පෙනෙනා සාර්ථකත්වයන් ගණනාවක් සමගින් සමාලෝචිත වර්ෂය තුළ ස්වකීය මෙහෙවර ඉටු කිරීමට සමත්ව සිටී.

ස්වකීය බලපැවරුම තුළ ඉදිරියෙන්ම ඇත්තේ දීප ව්‍යාප්ත සේවාවන් හට සේවාරම්භක සහ ධාරිතා පුහුණු පැවැත්වීමය. ඒ අනුව 2018 වසර තුළදී පොදු යහපත සාධනය උදෙසා වන ජවයක් සහිතව ජනතා හිතවාදී වෘත්තීමය තත්වයක් පවත්වා ගැනීම පිණිස රාජ්‍ය අංශයට අලුතින් බඳවාගනු ලැබූ මේ සේවකයන් යොමු කිරීමේ අභිලාශයෙන් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය උදෙසා සේවාරම්භක පුහුණු තුනක් පවත්වනු ලැබිණි.

මේ වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය සේවකයන්ගේ උපකාරයට හේතුවන අයුරින් දිස්ත්‍රික්කයන් තුළ ජංගම පුහුණු වැඩසටහන් ආරම්භ කළ බව පැවසීමට කැමැත්තෙමි. එසේම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තුළ පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමද දිගු කාලයක් පැවති අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමකි. රාජ්‍ය කළමනාකරණ න්‍යාය සහ පරිචය තුළ ඇති ගැටළු ආමන්ත්‍රණයේදී පර්යේෂණයන් තුළින් ලබාගන්නා තොරතුරු මහෝපකාරී වන හෙයින් සේවා සම්පාදනයට අදාල ගැටළු පිළිබඳ පර්යේෂණයන් පැවැත්වීම ඉතා වැදගත් කාර්යයකි. ස්වකීය ආයතනයන් තුළ සේවා සම්පාදන කාර්යය වැඩි දියුණු කිරීම උදෙසා වන විසඳුම් සොයා ගැනීමේ ලා උනන්දුවක් දක්වන්නා වූද විවිධ රජයේ ආයතනයන්ට අනුයුක්ත කර ඇත්තා වූද නිලධාරීන් හට අදාල පර්යේෂණයන් පැවැත්වීම සඳහා මේ මධ්‍යස්ථානය භාවිතා කළ හැකිය. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි පශ්චාත් උපාධි විද්‍යායතනය රාජ්‍ය අංශයෙහි කළමණාකරුවන්ගේ මධ්‍ය මට්ටමේ වෘත්තිකත්වයන් සංවර්ධනය උදෙසා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඉහලම මට්ටමේ පශ්චාත් උපාධි පාඨමාලාවක් පවත්වන අතර 2018 වසරෙහිදී ඊට නව කණ්ඩායමක් ද බඳවා ගන්නා ලදී.

සමාලෝචිත වර්ෂය තුළ අදාල ඉලක්කයන් කරා ළඟාවීම පිණිස දෙනු ලැබුවාවූ අනගි උපදෙස් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි පාලක සභාවෙහි සාමාජිකයන්හට මගේ නොවක් තුති පුද කිරීමට ද මම මේ අවස්ථාව කරගනු කැමැත්තෙමි. තවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ඉලක්ක සපුරා ගැනීම පිණිස දක්වන ලද කැපවීම සම්බන්ධයෙන් මම මෙහිදී ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ කාර්ය මණ්ඩලයට ද කෘතවේදීත්වය පුද කරනු කැමැත්තෙමි. එසේම වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි අභිවෘද්ධිය උදෙසා සිය දායකත්වය සැපයූ සියල්ලන්ටම සතුට සහ සමෘද්ධිය පිරි අනාගතයකට සුභ පැතුම් පිරිනමනු කැමැත්තෙමි.

ජේ.ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය,
සභාපති,
පාලක සභාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

1.2 අධ්‍යක්ෂ ජනරාල්වරියගේ පණිවුඩය



සමාලෝචිත වර්ෂය බොහෝ පාර්ශවයන්ගෙන් බලන විට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට බෙහෙවින් වැදගත් වසරක් වන අතර එකී කාලය තුළ අපි වැදගත් ජයග්‍රහණ කිහිපයක්ම අත් කරගැනීමට සමත් වීමු. ඒ අතරින් කැපී පෙනෙන ජයග්‍රහණයක් වනුයේ 'ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හරිත ලොවක් උදෙසා යන ගමන වෙනුවෙන්' හරිත බලශක්ති සම්මානය හිමිකර ගැනීමට සමත් වීමයි. අතිගරු ජනාධිපතිතුමා සහ රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා ගේ සහභාගීත්වයෙන් ඔපවත්වූ උත්සවයකදී ශ්‍රී ලංකාවේ ජර්මානු තානාපති කාර්යාලය සහ ජී අයි ඉසෙඩ් ආයතනය මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට අදාල සම්මානය පිරිනමනු ලැබිණි.

එම වසරේදීම 2018 වසර සඳහා වන පරිසර සම්මානය දිනා ගැනීමට ද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමත් විණි. රජයේ 'පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතා ජාල ව්‍යාපෘතියට අනුගත වෙමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් ද ස්වකීය හරිත මුලපිරුම් උදෙසා සතියක් ප්‍රකාශයට පත් කරනු ලැබිණි. ශ්‍රී ලංකාවෙහි ජර්මානු තානාපතිවරයා ඇතුළු සම්භාවණීය පිරිසක් හමුවෙහි උත්සවාකාරයෙන් එකී ආරම්භය සනිටුහන් කරනු ලැබිණි. සේවා සහ නිපැයුම් අංශය යටතේ 2018 වසරෙහි ජාතික ඵලදායිතා සම්මාන තරගාවලියෙහිදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට අභිමානවත් ලෙස තෙවන ස්ථානය දිනා ගැනීමට ලැබිණි.

රාජ්‍ය සේවකයන්ගේ අවශ්‍ය නිපුණතාවන් සංවර්ධනය කිරීමට අදාල මූලික කාර්යයන් ඉටු කරමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විදෙස් පුහුණු සංරචකයන් ද ඇතුලත් ඩිප්ලෝමා පාඨමාලා 9ට අමතරව සහභාගිවන්නන් 964 දෙනකු උදෙසා පාඨමාලා 29ක් සාර්ථකව පැවැත්වීය. තවද, සහභාගිවන්නන් 1281 සඳහා අභිරුචිකරණ පුහුණු පාඨමාලා 43 පවත්වන ලද අතර වසර තුළදී සාර්ථක අයුරින් කෙටිකාලීන උපලේඛණගත පාඨමාලා 17ක්ද පවත්වන ලදී. ඒ අතරම සේවාලාභී ආයතනයන්ගේ ඉල්ලීම් මත කළමනාකරණ උපදේශන සේවාවන් දෙකක්ද ලබාදෙනු ලැබිණි. 2017-2021 උපායමාර්ගික සැලසුමෙහි ඇතුලත් නව ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක කරමින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හී සේවා සම්පාදනයෙහි කාර්යක්ෂමතාව වර්ධනය කිරීම උදෙසා දිස්ත්‍රික් මට්ටමින් ජංගම පුහුණු වැඩසටහන් 5ක් පවත්වනු ලැබිණි.

වසර තුළ රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධිය පිණිස සහභාගිවන්නන් 82 කින් සමන්විත නව කණ්ඩායමක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසලට බඳවා ගනු ලැබිණි. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයෙහිද විධායක මට්ටමේ නිලධාරීන්ගේ වෘත්තීය නිපුණතා වර්ධනය කිරීමේ අරමුණින් දේශීය මෙන්ම විදේශීය විද්වත් විශේෂඥයන්ගේ සහභාගීත්වයෙන් පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් ප්‍රසිද්ධ දේශන මාලාවක් ද සංවිධානය කරනු ලැබිණි.

වසර තුළ අත්කරගත් තවත් ජයග්‍රහණයක් වනුයේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තුළ පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට ලද අවස්ථාවය. ඒ වනාහී දිගු කලක් තිස්සේ අපේක්ෂිත අරමුණක් ඉටුකර ගැනීමකි. පර්යේෂණයන්හී තොරතුරු මත ප්‍රතිපත්ති සම්පාදනය මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම ද වඩා සඵලදායී බැව් සලකා බලමින් රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණයට අදාල පර්යේෂණ පැවැත්වීම දිරිගන්වන ලද අතර අවශ්‍ය පහසුකම් ද සපයනු ලැබිණි.

ඉහත සඳහන් ජයග්‍රහණයන් අත්පත් කරගැනීම පිණිස මග සදමින් සහ අභිමුඛ වන අභියෝගයන් ජයගනිමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි සමස්ත කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද දායකත්වය, කැපවීම සහ සහයෝගීතාව මෙහිලා මවිසින් අනිවාර්යයෙන් ම සඳහන් කරනු ලැබිය යුතුය. අවශ්‍ය මාර්ගෝපදේශ, උපදෙස් සහ පහසුකම් සැපයීම වෙනුවෙන් අපේ කෘතවේදීත්වය රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍යතුමන්ට, පාලක සභාවට මෙන්ම අපේ සියළුම පාර්ශවකරුවන්ට සහ සමස්ත කාර්ය මණ්ඩලයට කෘතවේදීත්වය පළ කිරීමට කැමැත්තෙමි.

කේ. එම්. එස්.ඩී. ජයසේකර
අධ්‍යක්ෂ ජනරාල්

02. මූල්‍ය අංශයෙහි කැපී පෙනුන අවස්ථා

මූල්‍ය විග්‍රහය	2018	2017	2016
භාණ්ඩාගාර දායකත්වය	133,612,634.00	134,878,943.00	158,292,480.00
අනෙක් ආදායම්	168,727,683.00	227,819,603.00	206,195,096.00
මුළු ආදායම	302,340,317.00	362,698,546.00	364,487,576.00
මුළු වියදම්	318,768,799.00	346,657,892.00	290,412,354.00
අතිරික්තය/ ඌනතාවය	(16,428,481.00)	16,040,653.00	74,075,222.00
මුළු වත්කම්	884,324,572.00	783,118,911.00	809,841,449.00
මුළු වගකීම්	224,994,820.00	179,600,089.00	254,292,080.00
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය	659,329,751.00	603,518,821.00	555,549,369.00







S L I D A


කුලිය
මිලියන
20.00
15.00
10.00
5.00
-
11.77
8.52
16.41
2016
2017
2018


පශ්චාත් උපාධි අධ්‍යයන අංශය
මිලියන
25.00
20.00
15.00
10.00
5.00
-
24.22
20.68
17.49
2016
2017
2018


ආයෝජන මත ආදායම
මිලියන
35.00
30.00
25.00
20.00
15.00
10.00
5.00
-
23.82
31.94
31.86
2016
2017
2018


උපදේශන සේවා
මිලියන
150.00
100.00
50.00
-
113.01
137.48
33.81
2016
2017
2018


ශාලා කුලී
මිලියන
20.00
15.00
10.00
5.00
-
4.34
6.37
18.55
2016
2017
2018


භාෂා පාඨමාලා
මිලියන
14.00
12.00
10.00
8.00
6.00
4.00
2.00
-
12.49
7.10
10.88
2016
2017
2018


ණය පොලී
මිලියන
0.70
0.65
0.60
0.55
0.50
0.56
0.63
0.67
2016
2017
2018


සමස්ථ ආදායම
මිලියන
400.00
350.00
300.00
250.00
200.00
150.00
100.00
50.00
-
364.51
358.85
302.34
2016
2017
2018


සමස්ථ වියදම
මිලියන
360.00
340.00
320.00
300.00
280.00
260.00
290.41
346.66
318.77
2016
2017
2018


කාල පරිච්ඡේදයෙහි අතිරික්තය / හිඟය
මිලියන
80.00
60.00
40.00
20.00
-
(20.00)
(40.00)
74.10
16.04
(16.43)
2016
2017

03. පාලක සභාවෙහි සාමාජිකයන්

1982 අංක 09 දරණ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පණතෙහි 6 (1) වගන්තිය ප්‍රකාර ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් පුද්ගලයන් 2018 වසර සඳහා ආයතනයේ පාලක සභාව ලෙස පත් කරන ලදී.



ජේ.ජේ. රත්නසිරි මහතා
සභාපති,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
(2018.01.01 සිට 2018.05.21 දක්වා)



පද්මසිරි ජයමාන්න මහතා
සභාපති,
ලේකම්,
රාජ්‍ය පරිපාලන,
කළමනාකරණ, නීතිය සහ
සාමය පිළිබඳ අමාත්‍යාංශය
(2018.05.22 සිට 2018.12.31. දක්වා)



සමන් ඒකනායක මහතා
සාමාජික,
අග්‍රාමාත්‍ය ලේකම්,
අග්‍රාමාත්‍ය කාර්යාලය,
අංක. 58, අර්නස්ට් ද
සිල්වා මාවත,
කොළඹ 07.



එස්.ටී. කොඩිකාර මහතා
සාමාජික,
ලේකම්,
රාජ්‍ය පරිපාලන,
කළමනාකරණ, නීතිය
සහ සාමය පිළිබඳ
අමාත්‍යාංශය



ඩී.සී. දිසානායක මහතා
සාමාජික,
ලේකම් උසස් අධ්‍යාපන සහ
මහා මාර්ග අමාත්‍යාංශය,
අංක 216,
මග නැගුම මහ මැදුර,
ඩෙන්සිල් කොබ්බෑකඩුව
මාවත, කොස්වත්ත,
බත්තරමුල්ල.
(2018.01.01 සිට 2018.05.21 දක්වා)



ජේ.ජේ. රත්නසිරි මහතා
සාමාජික,
ලේකම්,
උසස් අධ්‍යාපන හා
අධිවේගී මාර්ග සංවර්ධන
අමාත්‍යාංශය
(2018.05.22 සිට 2018.12.31. දක්වා)



එච්.ටී. කමල් පත්මසිරි මහතා
සාමාජික,
ලේකම්, පළාත් සභා
සහ පළාත් පාලන
අමාත්‍යාංශය,
අංක. 330, කොල්වින් ආර්
ද සිල්වා මාවත,
(යුනියන් පෙදෙස)
කොළඹ 02.



පී.බී.එස්.සී. නෝනිස් මහතා
සාමාජික,
කොම්ප්ට්‍රෝලර්
ජනරාල්, මුදල් සහ
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.



චාරන් අමරතුංග මහතා
සාමාජික,
කළමනාකරණ
උපදේශක,
අංක. 10B, ගවර් වීදිය,
කොළඹ 05.



ඩී.ඒ. විජිත් මහේන්ද්‍ර රත්නසේකර මහතා
සාමාජික,
කන්දෙවත්ත ටෙරස්,
1/31 ඒ,
පිටත පූර්වාරාම පාර,
නුගේගොඩ



ඒස්. සුරේෂ් සී. ප්‍රනාන්දු මහතා
සාමාජික,
අංක. 3 බී,
හුළුදාගොඩ පාර,
පිටත ටෙම්ප්ලර්ස් පාර,
ගල්කිස්ස.



වසන්තා පෙරේරා මහත්මිය
සාමාජික,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සංවර්ධන
පරිපාලන ආයතනය,
අංක 28/10,
මලලසේකර මාවත,
කොළඹ 07.
(2018.01.01 සිට 2018.09.27
දක්වා)



කේ.එම්.එස්.ඩී. ජයසේකර මහත්මිය
සාමාජික,

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන
ආයතනය
(2018.09.28 සිට 2018.12.31.
දක්වා)

04. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය

වසන්තා පෙරේරා මිය

අධ්‍යක්ෂ ජනරාල් (2018.01.01 සිට 2018.09.27 දක්වා)

ශ්‍රීලංපසේ විශේෂ ශ්‍රේණිය

ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, තාක්ෂණවිද්‍යා සරසවිය, සිඩ්නි, ඕස්ට්‍රේලියා

ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

විද්‍යාවේදී උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

කේ.එම්.එස්.ඩී.ජයසේකර මිය

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) (2018.09.28 සිට 2018.12.31 දක්වා)

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉගෙනුම් සහ සංවර්ධන)

ශ්‍රීලංපසේ විශේෂ ශ්‍රේණිය

රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, වික්ටෝරියා විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

විද්‍යාවේදී (ජීව විද්‍යා) උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

පී.ඩබ්. රාජපක්ෂ මිය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන සහ මූල්‍ය)

ශ්‍රීලංපසේ විශේෂ ශ්‍රේණිය

ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය, මොනෑෂ් විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, (Merit Pass), ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ බණ්ඩාරනායක මධ්‍යස්ථානය

විද්‍යාවේදී ව්‍යාපාර කළමණාකැරනය පිළිබඳ (විශේෂ) උපාධිය (දෙවන පෙල පහල සමත්) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

එන්.ජේ.ජයසුන්දර මිය

ජ්‍යෙෂ්ඨ උපදේශිකා

පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය

විද්‍යාවේදී කෘෂිකර්ම (ගෞරව) උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පරිසර කළමනාකරණය පිළිබඳ වෘත්තීය සහතිකය (ජීඩීසී. ජර්මනිය)

ඩබ්.එම්. එම්.ජී. ඩී. විජේකෝන් මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක
නාගරික පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය, AIT - තායිලන්තය
ශාස්ත්‍රපති (ගෞරව), භූගෝල විද්‍යාව, කොළඹ විශ්ව විද්‍යාලය

ඒ. ලොකුගමගේ මහතා

ශ්‍රී ලං ග සේ (1 ශ්‍රේණිය)
ශාස්ත්‍රපති (මූල්‍ය ආර්ථික විද්‍යාව) කොළඹ විශ්ව විද්‍යාලය,
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ආයතනික සහ උපාය මාර්ගික මූල්‍යනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
HNDA, DPFM, DIPPCA, Dip in IT, MAAT

ආචාර්ය එස්. ආර්. එස්.එන්. සුදසිංහ

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පළඩිපා) රාජකාරී ආවරණය කරන
ජ්‍යෙෂ්ට උපදේශක, අධ්‍යයන සම්බන්ධීකාරක-පශ්චාත් උපාධි අධ්‍යයන පාසල
සංවර්ධන පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය, (රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය පිළිබඳ විශේෂ)
පශ්චාත් උපාධිය (ආර්ථික විද්‍යා), කොළඹ විශ්ව විද්‍යාලය
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

ඒ.බී.එම්. අශ්රෆ් මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක (2018.01.01.සිට 2018.04.09 දක්වා)
ශ්‍රී ලං ප සේ 1 ශ්‍රේණිය
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රවේදී (ගෞරව) පේරාදෙණිය විශ්ව විද්‍යාලය

නීතිඥ ආර්. දිසානායක මිය

ජ්‍යෙෂ්ඨ උපදේශක - ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)
දිවුරුම් කොමසාරිස්
විද්‍යාපති රාජ්‍ය කළමනාකරණ (ව්‍යාපෘති කළමනාකරණ)
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
නීතිවේදී, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී (ගෞරව), කැලණිය විශ්ව විද්‍යාලය
DIPPCA.

ටී. අබේවර්ධන මිය

ජ්‍යෙෂ්ඨ උපදේශිකා
ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධිය, ICU, ටෝකියෝ, ජපානය
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පරිසර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
යහපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී සත්ව විද්‍යා (විශේෂ) උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලං සං පරි ආ

කේ. ආර්. ගංගාධාර මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක

ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)

විද්‍යාපති ජාත්‍යන්තර සහ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි ඩිප්ලෝමා, (ඒඑන්යූ- ඔස්ට්‍රේලියා)

විද්‍යාවේදී භූවිද්‍යා උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලං සං පරි ආග

එන්.අයි. ලියනගේ මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක (2018.01.01. සිට 2018.02.21 දක්වා)

ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)

MPPM (Melbourne), Australia

සංවර්ධන කැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, රුහුණු විශ්ව විද්‍යාලය,

විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය (ගෞරව)

එම්.එස් අනුරුද්ධ මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක (2018.02.28 සිට)

ශ්‍රී ලං ග සේ (1 ශ්‍රේණිය)

ශාස්ත්‍රපති ආර්ථික විද්‍යා උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය

ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය, රජරට විශ්ව විද්‍යාලය

ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ බණ්ඩාරණායක මධ්‍යස්ථානය

විද්‍යාවේදී (විශේෂ) අලෙවි කළමනාකරණ, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

එස්. ඩී. එන්. යූ. සේනාධීර මහතා

ජ්‍යෙෂ්ඨ උපදේශක (2018.12ග 07 සිට)

රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලය, ඇඩිලේඩ්, ඔස්ට්‍රේලියා

වාග් විද්‍යා පශ්චාත් උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය

ශාස්ත්‍රවේදී උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

එන්. එම්. එස්. ඒ. බණ්ඩාර මහතා

උපදේශක

තොරතුරු තාක්ෂණ විද්‍යාපති උපාධිය, මොරටුව විශ්ව විද්‍යාලයල

විද්‍යාවේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, වනවිද්‍යා විද්‍යාපත උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

එම්. ආර් වක්කුඹුර මිය

උපදේශිකා (2018.01.01. සිට 2018.09.03 දක්වා)

සාමය සහ ගැටුම් අධ්‍යයන දර්ශනපති උපාධිය, ඔස්ලෝ විශ්ව විද්‍යාලය, නෝර්වේ

ශාස්ත්‍රපති (ගෞරව) - ජාත්‍යන්තර සම්බන්ධතා, කොළඹ විශ්ව විද්‍යාලය

මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව, මානව හිමිකම් ආයතනය, ශ්‍රී ලංකාව

සාමය පිළිබඳ පර්යේෂණ උපාධි වැඩ සටහන, පීආර්අයිඕ සහ ඔස්ලෝ විශ්ව විද්‍යාලය, නෝර්වේ

එම්. පෙරේරා මහතා

සහය උපදේශය

කෘත්‍රිම බුද්ධිය පිළිබඳ පශ්චාත් විද්‍යාවේදී උපාධිය, මොරටුව විශ්ව විද්‍යාලය

තොරතුරු තාක්ෂණ උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය.

4.2 සේවා පහසුකම් සපයන්නන්ගේ තොරතුරු

ඩී.එස් පද්මසිරි මහතා

අධ්‍යක්ෂ (මුදල්)

ශ්‍රී ලං ග සේ (1 ශ්‍රේණිය)

විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන (විශේෂ) උපාධිය

කේ. ප්‍රසන්න චන්දිත් මහතා

අධ්‍යක්ෂ (පරිපාලන)

ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)

රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය, රජරට විශ්ව විද්‍යාලය

විද්‍යාවේදී විද්‍යා උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

තිරසර සංවර්ධනය සඳහා වන අධ්‍යාපන ඩිප්ලෝමාව, UppasalaUniversity ස්වීඩන්

රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (ස්වීඩන්)

ජේ.එස්. පී. පියසේන මහතා

අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ සහ වැඩ සටහන් ප්‍රවර්ධන)

ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)

සමාජවිද්‍යා පශ්චාත් උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය

විද්‍යාවේදී ව්‍යාවහාරික විද්‍යා උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

ආර්.ඒ.එස්.පී. රණවීර මහතා

ලේඛකාධිකාරී, පශ්චාත් උපාධි ඩිප්ලෝමා (Ind. Mathematics)

විද්‍යාවේදී (ගෞරව)

ටී.එස්. කරස්නාගොඩ මිය

සහකාර අධ්‍යක්ෂිකා (විභාග) (2018.01.01 සිට 2018.12.03 දක්වා)

ශ්‍රී ලං ප සේ

සේවා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

විද්‍යාවේදී (විද්‍යා)

රාජ්‍ය පරිපාලන ඩිප්ලෝමාව

ටී.ඩී. නාරංගොඩ මිය

අභ්‍යන්තර විගණක

ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා) කැළණිය විශ්ව විද්‍යාලය

වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

මානව සම්පත් (විශේෂ)

බී.ඒ.පී. බාලසූරිය මිය

පුස්තකාලයාධිපතිනි
පුස්තකාල සහ තොතුරු විද්‍යා පශ්චාත් උපාධිය
ශාස්ත්‍රවේදී, කැළණිය විශ්ව විද්‍යාලය
කළමනාකරණ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල

එස්.එල්. අයි. සමරවික්‍රම මිය

සහකාර ලේඛකාධිකාරී
ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා) කැළණිය විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ විශේෂ උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

05 කාර්ය සහ සංවිධාන ව්‍යුහය

5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය ව්‍යුහය



5.2 ශ්‍රී ලං සං පරි ආයතනයේ සංවිධාන ව්‍යුහය



06. අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙහි විධායක නිලධාරීන්ගේ පුහුණු සහ සංවර්ධන අවශ්‍යතා සැපයීමේ අරමුණින් 1982 වසරේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ස්ථාපිත කරන ලදී. ඉගෙනුම සහ සංවර්ධනය මෙහි මුඛ්‍ය පාර්ශවය වන අතර එමගින් රාජ්‍ය අංශයෙහි නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතා සපුරාලීම පිණිස සකසන ලද ඉගෙනුම් සහ සංවර්ධන සේවාවන් මෙමගින් සැපයේ. මෙකී කාර්යය උදෙසා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය අංශයෙහි සංවිධානයන්හී සහ එහි කළමනාකාරීත්ව කාර්ය මණ්ඩලයන්හී නිපුණතා වර්ධනය පිණිස පහත ක්‍රියාකාරකම් සිදු කරයි.

1. පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන් සඳහ බඳවා ගනු ලබන නවක නිලධාරීන් වෙනුවෙන් සේවාරම්භක පාඨමාලා පැවැත්වීම (ගාස්තු අය නොකරන පාඨමාලා)
    i. ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං ප සේ)
    ii. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී ලං ග සේ)
    iii. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (ශ්‍රී ලං ක්‍ර සේ)
    iv. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (ශ්‍රී ලං වි සේ)
    v. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය (ශ්‍රී ලං වා වි සේ)
    vi. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (ශ්‍රී ලං ඉ සේ)
    vii. ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (ශ්‍රී ලං තො ස තා සේ)
2. 1 වන සහ 111වන පංතියේ මට්ටම් වලදී දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් හට අනිවාර්ය වන ධාරිතා සංවර්ධන වැඩ සටහන් (ගාස්තු අය නොකරන වැඩ සටහන්)
3. ඩිප්ලෝමා වැඩ සටහන් (ගාස්තු අය කරනු ලබන)
4. කෙටි කාලීන පුහුණු වැඩ සටහන් (ගාස්තු අය නොකරන වැඩ සටහන්)
5. අභිරුචිකරණ පුහුනු වැඩ සටහන් රාජ්‍ය අංශයේ ආයතන සහ රාජය ව්‍යවසායකත්වයන්හී ඉල්ලීම් මත පදනම්ව (ගාස්තු අය කරනු ලබන පාඨමාලා)
6. කළමනාකරණ උපදේශනයන් (ගාස්තු අය කරනු ලබන)
7. සම්මන්ත්‍රණ (ගාස්තු අය කරනු ලබන සහ අය කරනු නොලබන වැඩ සටහන්)

සමාලෝචිත වර්ෂය තුළදී පහත සඳහන් වැඩ සටහන් පවත්වන ලදී.

6.1 සේවාරම්භක පුහුණු පාඨමාලා

ස්වකීය අදාල සේවාවන්හී පෙරටුගාමීන් ලෙස කටයුතු තිරීම පිණිස අවශ්‍ය පුලුල් පරාසයකින් යුත් විෂය කාරණා සහ අනෙක් අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ලබාදීමේ අරමුණින් දීප ව්‍යාප්ත සේවාවන්ට බඳවා ගනු ලබනා නවක නිලධාරීන් වෙනුවෙන් සේවාරම්භක පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. ප්‍රධාන විෂය කරුණු සම්බන්ධයෙන් වන මොඩියුලයන්ට අමතරව කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙහි සහභාගීත්වය සහිතව බැහැරගත පුහුණු ආකාරයෙන් පුද්ගල පෞරුෂ සංවර්ධනය පිණිස විශේෂ වැඩ සටහන් මේ පුහුණුවට ඇතුලත කරනු ලබයි. තවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ භාෂා මධ්‍යස්ථානය විසින් ස්වකීය සේවාරම්භක පුහුණුව අතර ඉංග්‍රීසි භාෂා පුහුණුවක් පවත්වන ලදී. ඇතැම් වැඩ සටහන් බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සහයෙන් ක්‍රියාත්මක කෙරිණි.

සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දීප ව්‍යාප්ත සේවාවන්හී බඳවා ගනු ලැබූ නිලධාරීන් 310 ක් උදෙසා සේවාරම්භක පුහුණු පාඨමාලා 3ක පැවැත්වූ අතර එකී පුහුණු පාඨමාලාවන්හී විස්තර පහත පරිදි වේ.

අනු අංකය	දීප ව්‍යාප්ත සේවාව	සහභාගී වූ අයගේ සංඛ්‍යාව	ප්‍රගතිය
01	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (පළමු කණ්ඩායම)	28	සම්පූර්ණ කරන ලදී
02	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (දෙවන කණ්ඩායම)	22	පැවැත්වෙමින් තිබේ
03	ශ්‍රී ලංකා භාෂා පරිවර්තක සේවය	51	සම්පූර්ණ කරන ලදී
04	ශ්‍රී ලංකා ඉංජිනේරු සහ වාස්තු විද්‍යාඥ සේවය	209	පැවැත්වෙමින් තිබේ
	එකතුව	**310**	

6.2 දීප ව්‍යාප්ත සේවාවන් සඳහා වන අනිවාර්ය ඉගෙනුම් සහ සංවර්ධන පුහුණු වැඩ සටහන්

දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා අවශ්‍ය වන්නාවූ දැනුම, කුසලතා මෙන්ම ආකල්ප අඛණ්ඩව සංවර්ධනය කිරීම මෙන්ම ඔවුන් ඉන් පෝෂණය කිරීම ස්වකීය මුඛ්‍ය වගකීම් අතරින් එකක් බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් හඳුනාගනු ලැබ තිබේ.

දීප ව්‍යාප්ත සේවාවන්හී සේවා ව්‍යවස්ථා අනුව එමගින් අදාල සේවාවන්හී සෑම නිලධාරියකු හටම අනිවාර්ය කර ඇති අවශ්‍යතාවක් වනුයේ සේවාරම්භක පුහුණු පාඨමාලාව සහ ධාරිතා සංවර්ධන වැඩ සටහන් නිසි ලෙස සම්පූර්ණ කිරීමයි.

එහෙයින් මෙකී නිලධාරීන් අතර අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් සුපෝෂණය කිරීම කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් සහතික කිරීම උදෙසා ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන්නාවූ කරුණකි. ඒ අනුව දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් උදෙසාම පවත්වනු ලබනා මෙකී වැඩ සටහන් පහත සංකල්ප මත පදනම් වේ.

- කලින් කලට අවශ්‍ය වන්නාවූ එසේම විශේෂයෙන් හඳුනාගනු ලැබ ඇති චර්යාමය සහ තාක්ෂණික නිපුණතාවන් සුපෝෂණය
- සීඝ්‍රයෙන් වෙනස්කම් වලට බඳුන් වන්නාවූ පරිසරයක් තුළ වැඩිවෙමින් පවත්නා අභියෝගයන්ට අනුව කටයුතු කරනු පිණිස අවශ්‍ය වන්නාවූ දැනුම සහ කුසලතා අඛණ්ඩව යාවත්කාලීන කිරීම

ඒ අනුව 2018 වසර තුලදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, සහ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය උදෙසා එහි නිලධාරීන් 925කට මධ්‍ය වෘත්තික ධාරිතා සංවර්ධන වැඩ සටහන් පවත්වන ලද අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවය	කණ්ඩායම් සංඛ්‍යාව	සහභාගි වූවන්ගේ සංඛ්‍යාව	ප්‍රගතිය
ශ්‍රී ලංකා පරිපාලන සේවය (1 ශ්‍රේණිය)	6	179	සම්පූර්ණ කරනු ලැබිණි
ශ්‍රී ලංකා පරිපාලන සේවය (1 ශ්‍රේණිය)	8	292	කණ්ඩායම් 5 ක් සම්පූර්ණ කරනු ලැබිණි
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (1 ශ්‍රේණිය)	5	120	කණ්ඩායම් 7 ක් සම්පූර්ණ කරනු ලැබිණි
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (111 ශ්‍රේණිය)	6	233	පැවැත්වෙමින් තිබේ
ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය (1 ශ්‍රේණිය)	4	140	සම්පූර්ණ කරනු ලැබිණි
එකතුව	**29**	**964**	

1 ශ්‍රේණියෙහි නිලධාරීන් උදෙසා වන ධාරිතා සංවර්ධන වැඩ සටහනට විදෙස් අත්දැකීම් ලබා ගැනීම උදෙසා වන සංචාරයක් ද ඇතුලත් කරන ලදී. මෙකී වැඩ සටහනෙහි අරමුණ වූයේ ස්වකීය ඉගෙනුම් ක්‍රියාවලිය අතර ප්‍රයෝගික ඉගෙනුම් සහ අත්දැකීම් ලබා ගැනීම පිණිස සහභාගිවන්නන් උදෙසා විදෙස් අත්දැකීම් ලබා දීමයි. පුහුණු විෂය මාළාව සහ ක්‍රමවේදය ප්‍රධාන වශයෙන්ම අත්දැකීම් හුවමාරුව සහ ජාත්‍යන්තර වශයෙන් හොඳම

පරිචයන් ඉගෙනුම් ඉලක්ක කරමින් ඉලක්කගත කණ්ඩායම සවිබලගැන්වීම උදෙසාවන උපාය මාර්ගයන් මත පදනම්ව පැවතියේය.

ඒ අනුව 2018 වසර තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහිදී ස්වකීය මධ්‍ය වෘත්තික ධාරිතා සංවර්ධන වැඩ සටහන සම්පූර්ණ කර සිටි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිලධාරීන් 136 දෙනකු සහ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයෙහි නිලධාරීන් 29 දෙනකු මැලේසියාවෙහි විදෙස් අත්දැකීම් ලබා ගැනීම පිණිස සංචාරයක නිරත කරවන ලද අතර ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයෙහි නිලධාරීන් 35 දෙනකු ඉන්දියාවෙහි විදෙස් අත්දැකීම් ලබා ගැනීම පිණිස වන සංචාරයක නිරත කරවන ලදී.

6.3 ඩිප්ලෝමා වැඩසටහන්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය අංශයෙහි ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය (DIPPCA) (HNDIPPCA), තොරතුරු තාක්ෂණය (DIT), කාර්යාල කළමනාකරණය (DOM), ගබඩා කළමනාකරණය (DSM), සහ වෘත්තිකයන් උදෙසා ඉංග්‍රීසි යන ඩිප්ලෝමා වැඩසටහන් පවත්වයි. මෙකී වැඩසටහන් බෙහෙවින් ජනප්‍රිය වන අතර රාජ්‍ය අංශයෙහි කාර්ය සාධනය වර්ධන උදෙසා එමගින් ඉතා වටිනා දායකත්වයක් සපයනු ලැබ තිබේ.

ඒ අනුව 2018 වසර තුළදී පහත සඳහන් ඩිප්ලෝමා වැඩ සටහන් පවත්වනු ලැබිණි.

අනු අංකය	වැඩ සටහනෙහි නම	වැඩසටහන් කාලය (දින)	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවන්න් සංඛ්‍යාව
01	තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව	මාස 6	1	20
02	කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	වසර 1	1	30
03	රාජ්‍ය අංශයෙහි ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව	වසර 1	2	97
04	රාජ්‍ය අංශයෙහි ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	මාස 14	4	164
05	තොග පාලනය පිළිබඳ ඩිප්ලෝමාව	වසර 1	1	36
	එකතුව		9	347

2018 වසර තුළදී පිළිවෙලින් රාජ්‍ය අංශයෙහි ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව සහ කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව හැදෑරූ නිලධාරීන් 28ක් සහ 23ක් ඉන්දියාවෙහි විදෙස් අත්දැකීම් ලබාගැනීමේ චාරිකාවක නිරත කරවන ලදී.

6.4 කෙටිකාලීන ඉගෙනුම් සහ සංවර්ධන වැඩ සටහන්

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පහත සඳහන් පරිදි කෙටි කාලීන පුහුණු වැඩ සටහන් පවත්වන 17ක් පවත්වන ලද අතර ඒ සඳහා මුලු සංඛ්‍යාවෙන් නිලධාරීහු 351ක් සහභාගී වූහ.

අනු අංකය	වැඩ සටහනෙහි නම	වැඩ සටහන් කාලය (දින)	වැඩ සටහන් සංඛ්‍යාව	සහභාගිවන්න් සංඛ්‍යාව
01	මානව සම්පත් කළමනාකරණය	2	2	33
02	ඵලදායීතාව සහ එස් පහ සංකල්පය පිළිබඳ වැඩමුළුව	1	1	15
03	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි සාරය	3	1	26
04	ලංසු ඇඟයුම පිළිබඳ වැඩ සටහන	3	1	27
05	ව්‍යාපෘති යෝජනා සැකසීම පිළිබඳ වැඩ සටහන	5	2	43
06	ඉහල මට්ටමේ එක්සෙල් වැඩ සටහන පිළිබඳ පුහුණුව	3	2	51
07	එම් එස් එක්සෙල් මගින් දත්ත පදනම් කළමනාකරණය	3	3	46
08	ප්‍රතිපත්ති පත්‍රිකා ලිවීම පිළිබඳ වැඩමුළුව	4	1	16
09	රාජ්‍ය අංශයෙහි විනය පරිපාටිය	5	1	29
10	පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව	5	1	26
11	අමාත්‍ය මණ්ඩල සංදේශ/ පත්‍රිකා සැකසීම පිළිබඳ වැඩමුළුව	3	1	15
12	තීරණ ගන්නන් උදෙසා මෘදු කුසලතා පිළිබඳ වැඩමුළුව	3	1	24
	එකතුව		17	351

6.5 අභිරුචිකරණ ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන්

මෙකී වැඩ සටහන් විශේෂයෙන්ම සැලසුම් කර ඇත්තේ සේවාලාභී ආයතනයන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්වලට ගැලපෙන අයුරිනි. 2018 වසර තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පුහුණු වැඩ සටහන් 43ක් පවත්වා ඇති අතර රාජ්‍ය අංශයේ ආයතනයන්හී ඉල්ලීම පරිදි නිලධාරීන් 1281ක් පුහුණු කර තිබේ. ඒ අනුව 2018 වසර තුළදී පහත සඳහන් අභිරුචිකරණ වැඩසටහන් පවත්වා තිබේ.

අනු අංකය	සේවාලාභී ආයතනය	අභිරුචිකරණ පුහුණු වැඩ සටහන් ක්ෂේත්‍රය	සහභාගී වූ සංඛ්‍යාව
1	ලංකා විදුලිබල මණ්ඩලය	කාර්යාල කළමනාකරණය සහ ලිපිගොනුකරණ පද්ධති පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන්	36
2	ජාතික ප්‍රවාහන කොමිසම	කළමනාකරුවන් උදෙසා වන අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	36
3	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරීන් උදෙසාවන අභිරුචිකරණ පුහුණු වැඩ සටහන 1 කණ්ඩායම	30
4	ජාතික පුස්තකාල සහ ප්‍රලේඛණ සේවා මණ්ඩලය	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් උදෙසා වන අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	18
5	විගණකාධිපති කාර්යාලය	සාකච්ඡා කුසලතා පිළිබඳ අභිරුචිකරණ වැඩසටහන	40
6	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩසටහන	25
7	විශේෂ කාර්ය සාධක බලකාය පුහුණු පාසල - ශ්‍රී ලංකා පොලිසිය	පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	30
8	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරීන් උදෙසාවන අභිරුචිකරණ පුහුණු වැඩ සටහන 11 කණ්ඩායම	30

9	රිගේලියා ටෝස්ට් මාස්ටර්ස්	කථන කුසලතා බලපත්‍රධාරී අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	25
10	විශේෂ කාර්ය සාධක බලකාය පුහුණු පාසල - ශ්‍රී ලංකා පොලිසිය	පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	30
11	ජාතික පොලිස් කොමිසම	පොලිස් අධිකාරීවරුන් උදෙසාවන විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන 1 කණ්ඩායම	36
12	පොලිස් මූලස්ථානය	කාර්යාල කළමනාකරණය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	20
13	ජාතික පොලිස් කොමිසම	පොලිස් අධිකාරීවරුන් උදෙසාවන විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන 11 කණ්ඩායම	36
14	ජාතික පොලිස් කොමිසම	පොලිස් අධිකාරීවරුන් උදෙසාවන විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන 111 කණ්ඩායම	36
15	නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය	කාර්යාල පද්ධති සහ ගිණුම්කරණ පද්ධති පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	15
16	ශ්‍රී ලංකා පොලිස් ප්‍රතිසංස්කරණ	නියෝජ්‍ය පොලිස්පති සහ ජ්‍යෙෂ්ට නියෝජ්‍ය පොලිස්පතිවරුන් සඳහා වන අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	80
17	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩසටහන	24
18	රිගේලියා ටෝස්ට් මාස්ටර්ස්	දීප ව්‍යාප්ත සේවානහී 1 පංතියේ නිලධාරීන් උදෙසා වන කථන කුසලතා පිළිබඳ ටොස්ට් මාස්ටර් අභිරුචිකරණ පුහුණු වැඩ - 1 කණ්ඩායම	20
19	රිගේලියා ටෝස්ට් මාස්ටර්ස්	දීප ව්‍යාප්ත සේවානහී 1 පංතියේ නිලධාරීන් උදෙසා වන කථන කුසලතා පිළිබඳ ටොස්ට් මාස්ටර් අභිරුචිකරණ පුහුණු වැඩ - 11 කණ්ඩායම	22
20	ජාතික පොලිස් කොමිසම	පොලිස් අධිකාරීවරුන් උදෙසාවන විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන IV කණ්ඩායම	35
21	ජාතික පොලිස් කොමිසම	පොලිස් අධිකාරීවරුන් උදෙසාවන විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන - V කණ්ඩායම	36
22	ජාතික පොලිස් කොමිසම	පොලිස් අධිකාරීවරුන් උදෙසාවන විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන - VI කණ්ඩායම	36
23	එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය	සංසක්තභාවය පිළිබඳ මාර්ගගත මොඩියුලය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ	30
24	සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය - (සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය)	පුහුණුකරුවන් පුහුණු කිරීමේ අභිරුචිකරණ වැඩ සටහන	30

25	විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය	රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණයට අදාල ගැටළු පිළිබඳ ව්‍යවහාරික පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම	39
26	තිරසර සංවර්ධන, වනජීවී සහ කලාපීය සංවර්ධන අමාත්‍යාංශය	කුඩා දිවයින් සංවර්ධන වෙමින් පවතින රාජ්‍යයන් වෙතින් පැමිණි නියෝජිත කණ්ඩායමක පහසුකම් සපයන්නා වීම	45
27	ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය	උප ලුතිනන්වරුන් (ලොජිස්ටික්) සඳහා වන රාජ්‍ය මූල්‍ය සහ රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණ මොඩියුලය	25
28	ජාතික පොලිස් කොමිසම	පොලිස් අධිකාරීවරුන් උදෙසාවන විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන - VII කණ්ඩායම	34
29	ජාතික පොලිස් කොමිසම	පොලිස් අධිකාරීවරුන් උදෙසාවන විනය පරිපාටිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන VIII කණ්ඩායම	35
30	ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව	ජ්‍යේෂ්ඨ සහ මධ්‍ය මට්ටමේ කළමනාකාරීත්වය උදෙසාවන අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	14
31	ශ්‍රී ලංකා බුද්ධිමය දේපල පිළිබඳ ආයතනය	අභිරුචිකරණ සේවාරම්භක පුහුණු වැඩ සටහන	20
32	ජයිකා ෆෝවර්ඩ් ව්‍යාපෘතිය	පුහුණුකරුවන් පුහුණු කිරීමේ අභිරුචිකරණ වැඩ සටහන - I කණ්ඩායම	23
33	ජයිකා ෆෝවර්ඩ් ව්‍යාපෘතිය	පුහුණුකරුවන් පුහුණු කිරීමේ අභිරුචිකරණ වැඩ සටහන - II කණ්ඩායම	13
34	රිගේලියා ටෝස්ට් මාස්ටර්ස්	විශේෂ ශ්‍රේණිය නිලධාරීන් උදෙසා වන කථන කුසලතා පිළිබඳ ටොස්ට් මාස්ටර් අභිරුචිකරණ පුහුණු වැඩ - I කණ්ඩායම	25
35	රාජ්‍ය පරිපාලන කළමනාකරණ නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයෙහි නිලධාරීන් උදෙසා වන කථන කුසලතා පිළිබඳ ටොස්ට් මාස්ටර් අභිරුචිකරණ පුහුණු වැඩ - I කණ්ඩායම	20
36	රාජ්‍ය පරිපාලන කළමනාකරණ නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයෙහි නිලධාරීන් උදෙසා වන කථන කුසලතා පිළිබඳ ටොස්ට් මාස්ටර් අභිරුචිකරණ පුහුණු වැඩ - II කණ්ඩායම	20
37	රාජ්‍ය පරිපාලන කළමනාකරණ නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය	මූලික විමර්ශන ක්‍රියාවලිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	28
38	සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය - (සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය)	පුහුණුකරුවන් පුහුණු කිරීමේ අභිරුචිකරණ වැඩ සටහන	24
39	කාර්මික අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව	බඳවා ගනු ලැබූ නවක නිලධාරීන් උදෙසාවන ධාරිතා සංවර්ධනය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩසටහන	40
40	සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත	මෘදු කුසලතා පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	30

41	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	40
42	ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව	සංයුක්ත සැලැස්ම සැකසීම පිළිබඳ අභිරුචිකරණ පුහුණු වැඩසටහන	25
43	සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය	කළමනාකාරීත්ව මට්ටමේ නිලධාරීන් උදෙසා වන අභිරුචිකරණ පුහුණු වැඩ සටහන	25
එකතුව			1281

6.6 කළමනාකරණ උපදේශනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඉගෙනුම් සහ සංවර්ධන අංශය රාජ්‍ය අංශයෙහි සංවිධාන වෙත කළමනාකරණ උපදේශන සේවා සැපයීමෙහි නිරත වේ. සාමාන්‍යයෙන් මෙකී උපදේශන සේවාවන් වනුයේ සේවක සංඛ්‍යා සමාලෝචනය, ක්‍රියාවලී, කාර්ය ප්‍රමාණ තක්සේරුව, සහ අත්පොත් සහ මාර්ගෝපදේශයන් සැකසීම, සංයුක්ත සැලසුම් සැකසීම, මානව සම්පත් සැලසුම් සැකසීම, සහ කාර්ය සාධන උපාය මාර්ග සැලසුම් සංවර්ධනය යනාදිය වේ. පහත සඳහන් සංවිධාන සංවර්ධන සේවාවන් 2018 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සපයනු ලැබිණි.

- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි සංවිධාන ව්‍යුහය පිළිබඳ අධ්‍යනය
- මධ්‍යම පරිසර අධිකාරියෙහි කාර්ය ප්‍රමාණ තක්සේරුව
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයෙහි කාර්යසාධන සංවර්ධන උපාය මාර්ගික සැලසුම සැකසීම

6.7 විදේශ පුහුණු ආයතනයන්හී සිටිනා නිලධාරීන් උදෙසා සම්බන්ධීකරණය කෙරෙන විදේශ අභිරුචිකරණ පුහුණු වැඩසහටන්

2018 වසර තුළදී රජයේ ගිණුම් සහ අභ්‍යන්තර විගණනය පිළිබඳව ඉන්දීය රජයේ ඉල්ලීම පරිදි නිලධාරීන් 32 ක් සඳහා විදෙස් අභිරුචිකරණ පුහුණු වැඩසටහන සම්බන්ධීකරනය කරනු ලැබිණි.

6.8 ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ

2018 වසර තුළදී රාජ්‍ය නිලධාරීන්ගේ දැනුවත්භාවය ගොඩනැගීමේ අරමුණින් කාලීන තේමාවන් පිළිබඳව පහත සඳහන් විශේෂ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

- තිරසර ප්‍රසම්පාදනය සහ ආසියානු රටවල තිරසර ප්‍රසම්පාදන වැඩපිලිවෙල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන අභියෝග පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය
- රාජ්‍ය අංශයෙහි ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් උදෙසා රාජ්‍ය ප්‍රසම්පාදන පරිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන

ඉහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් වලට අමතරව ඉගෙනුම් සහ සංවර්ධන අංශය මගින් පහත සඳහන් කාර්යයන් 2018 වසර තුළ ඉටු කෙරිණි.

6.9 අනෙකුත් මූලාරම්භයන්

- **ජංගම පුහුණු වැඩසටහන්**

2017- 2021 කාලය සඳහා වන උපායමාර්ගික සැලසුමෙහි ක්‍රියාකාරකමක් වශයෙන් 2018 වසර තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉගෙනුම් සහ සංවර්ධනය පිළිබඳ ජංගම සේවා ආරම්භ කරන ලදී. ඒ අනුව ආයතනය විසින් අදාල ආයතනයන්හී ඉල්ලීම පරිදි පලාත් සභා සහ දිස්ත්‍රික්ක උදෙසා සිය අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි විශේෂඥයන්ගේ සේවාව සපයන අතරම අනෙක් තාක්ෂණික සහයන් ද සපයනු ලබයි. එහිදී 2018 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් උඟව පලාත් සභාවෙහි මොණරාගල, සබරගමුව පළාත් සභාවෙහි රත්නපුර, වයඹ පළාත් සභාවෙහි පුත්තලම, සහ නැගෙනහිර පළාත් සභාවෙහි මඩකලපුව යන දිස්ත්‍රික්කවල ජංගම සේවා 4ක් පවත්වන ලදී.

අනු අංකය	වැඩ සටහනෙහි නම	පුහුණු මධ්‍යස්ථානය	දින ගණන	සහභාගී වූ සංඛ්‍යාව
1	කාල කළමනාකරණය සහ ප්‍රසම්පාදන පටිපාටිය	මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	1	100
2	ඊ -රාජ්‍ය සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ ජංගම පුහුණු වැඩසටහන	මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2	135
3	ලංසු ඇගයීම	පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2	60
4	තිරසර සංවර්ධන ඉලක්ක සහ ක්‍රියාකාරී සැලසුම	සබරගමුව පළාත් සභාව	1	36
5	පර්යේෂණ ක්‍රමවේදය	ළමා මහලේකම් කාර්යාලය	1	65

- **දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නම්නීකරණ වැඩසටහන**

අදාළ දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියට අලුතින් උසස් කරන ලද නිලධාරීන් තම නව සේවා ස්ථානවල රාජකාරි භාර ගැනීමට පෙර ඔවුන් සඳහා විස්තීර්ණ පුහුණු වැඩසටහනක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලදී. ඔවුන් තම නව අභියෝගකරුවන් සමග භාරගැනීමට සූදානම් වන තනතුරෙහි අවශ්‍යතා අනුව එහි මොඩියුල සකස් කරන ලදී. මෙම වැඩසටහන යටතේ නිලධාරීන් 24 දෙනෙක් 2018 වසර තුළදී පුහුණු කරන ලදී.

- **JICA FORWARD ව්‍යාපෘතියේ අරමුදල් යටතේ පවත්වන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්**

JICA FORWARD ව්‍යාපෘතිය 2013 මාර්තු මස සිට 2017 දෙසැම්බර් 31 වන දින දක්වා ක්‍රියාත්මක කරන ලදී. උතුරු, නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල ඉදිරි පෙළ නිලධාරීන් (FLOs) පුහුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතියේ 1 වන අදියර 2013 මාර්තු මස සිට 2016.03.31 දක්වා ද 2 වන අදියර 2016.10.01 සිට 2017.12.31 දක්වාද ක්‍රියාවට නංවන ලදී.

2013 මාර්තු මස සිට 2016.03.31 දක්වා ක්‍රියාත්මක කරන ලද 1 වන අදියර යටතේ ඉදිරි පෙළ නිලධාරීන් 1845 දෙනෙක් ද 2016.10.01 සිට 2017.12.31 දක්වා ක්‍රියාත්මක කරන ලද 2 වන අදියර යටතේ 1315 දෙනෙක් ද පුහුණු කරමින් නිලධාරීන් 900 ක් පුහුණු කිරීමේ ඉලක්කය අභිබවා ගොස් ව්‍යාපෘතියේ 146% ක කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගැනීමට මෙහිදී හැකි විය.

2 වන අදියර යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන්වල ඡායාරූප

උතුරු පළාත





නැගෙනහිර පළාත





උතුරු මැද පළාත





ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම්වලට සහාය වීම සඳහා ඉදිරි පෙළ නිලධාරීන්ගේ නිපුණතා සැලකිය යුතු මට්ටමකින් වැඩිදියුණු වී ඇති බව JICA ආයතනය විසින් සිදු කරන ලද ස්වාධීන ඇගයුම මගින් තහවුරු වේ.

ව්‍යාපෘතිය සාර්ථක අන්දමින් අවසන් කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ සමාප්ති රැස්වීම 2018.01.04 වන දින රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර ආරාධිත අමුත්තා වශයෙන් JICA ආයතනයේ ප්‍රධාන නියෝජිත Fusato TANAKA මහතා මෙයට සහභාගී වූයේය.

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්, J.J. රත්නසිරි මහතා, උතුරු, නැගෙනහිර සහ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරු සහ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ නිලධාරීහු ද මෙම රැස්වීමට සහභාගී වූහ.

ව්‍යාපෘති සමාප්ති රැස්වීමේ ඡායාරූප













ව්‍යාපෘති සමාප්ති රැස්වීමෙන් අනතුරුව කරන ලද නිර්දේශය මත පදනම්ව JICA FORWARD ව්‍යාපෘතියේ තිරසර බව සහතික කිරීම සඳහා එහි ඉතිරි අරමුදල්වලින් බස්නාහිරල දකුණ, වයඹ, සබරගමුව, මධ්‍යම සහ ඌව පළාත්වල පුහුණුකරුවන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් දෙක පිළිවෙලින් 2018.08.31 සිට 2018.09.01 දක්වා ද 2018.09.14 සිට 2018.09.15 දක්වා ද පැවැත්වුණු අතර පුහුණුකරුවන් 43 දෙනෙක් පුහුණු කරන ලදී.

1 වන වැඩසටහන – 31.08.2018 – 01.09.2018



2 වන වැඩසටහන– 14.09.2018 – 15.09.2018



මෙම සියලු පුහුණු වැඩසටහන් පවත්වන ලද්දේ JICA ආයතනයේ මූල්‍ය සහාය ඇතිවය.

07. පශ්චාත් උපාධි අධ්‍යයන පාසල

2003 වසරේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1985 අංක 07 දරණ පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25 ඒ වගන්තිය යටතේ පනවන ලද නියෝගයක් අනුව ශාස්ත්‍රපති උපාධි පිරිනැමීමේ තත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පිරිනමන ලදී. ඒ අනුව පශ්චාත් උපාධි අධ්‍යයන පාසල ස්ථාපිත කරන ලද අතර පසුව එම පාසල ජාතික, කලාපීය හා ජාත්‍යන්තර මට්ටමින් අබණ්ඩව රාජ්‍ය අංශයේ වෘත්තිකයන් සමග කටයුතු කරන ලදී. රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහනක් සකස් කිරීමට අදාළ තාර්කිකය පදනම් වූයේ වර්තමානයේ අමාත්‍යාංශයන්හි ලේකම්වරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා වෙනත් පාර්ශවකරුවන් ද එක සමානව තම කළමනාකරුවන්ගෙන් එකතු කරන ලද වටිනාකම් සහිත දායකත්වයක් අපේක්ෂා කරන ඉක්මණින් වෙනස් වන හා අභියෝගාත්මක රාජ්‍ය කළමනාකරණ පරිසරය මතයි. රාජ්‍ය කළමනාකරණය පිළිබඳ මෙම සුවිශේෂ පශ්චාත් උපාධි වැඩසටහන මගින් පශ්චාත් උපාධියක් ලබා ගැනීම සඳහා එය හදාරන්නන් දැනුමින් පෝෂණය කිරීම හා විවිධ කළමනාකරණ මට්ටම්වලදී අත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම සඳහා ඔවුන් කුසලතාවන්ගෙන් සන්නද්ධ කිරීම සිදු කෙරේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් පවත්වන රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන මෙරට ප්‍රධාන ප්‍රායෝගික පශ්චාත් උපාධි වැඩසටහනකි. ඒ අනුව එහි සහභාගිවන්නන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය, වැඩසටහනෙහි අන්තර්ගතය හා එය පවත්වන ආකාරය වෙනත් ඊට සමාන වැඩසටහන්වලට වඩා වෙනස් වන අතර සහභාගිවන්නන් සඳහා වෙනත් රටක ප්‍රායෝගික අත්දැකීම් ලබා ගත හැකි වන පරිදි එය සැලසුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වීමට වෘත්තිකයන්ගේ ඉහළ ඉල්ලුමක් පවතින අතර එම සංඛ්‍යාව ඉහළ යමින් පවතියි.



අද වන විට රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව

2018 වසර ආරම්භයේ දී පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් අපේක්ෂකයන් 82 දෙනෙකු ලියාපදිංචි වූ 2017-2019 කණ්ඩායම ඇතුළත් කර ගැනීමේ උත්සවය සංවිධානය කරන ලදී. 2018 වසර තුළ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන සඳහා කණ්ඩායම් තුනක් ඇතුළත් කරගෙන තිබූ අතර මුළු සිසුන් සංඛ්‍යාව 224ක් විය.

දැනුම නිර්මාණය කිරීම, යොදා ගැනීම, සංරක්ෂණය සහ බෙදාහැරීම සඳහා කැප වෙමින් පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් මෙරට රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ පිරිස් සඳහා කාලීන වැදගත්කමකින් යුත් මාතෘකා යටතේ සාකච්ඡා සහ ආරාධිත දේශන ගණනාවක් සංවිධානය කොට තිබේ. උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් රාජ්‍ය අංශය සඳහා සම්මන්ත්‍රණ වැනි විශේෂ අවස්ථා පවත්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පුද්ගලික අංශවල විධායක නිලධාරීන්ගේ කළමනාකරණ ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් ප්‍රසිද්ධ දේශන මාලාවක් සංවිධානය කොට තිබේගඵහි පළමු දේශනය පවත්වන ලද්දේ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික පර්යේෂණ සහ කර්මාන්ත ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා වන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය D. A. C. සිල්වා මහතා විසිනි.

මෙම දේශන මාලාවේ දෙවැන්න ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පුද්ගලික අංශවල විධායක නිලධාරීන්ගේ කළමනාකරණ ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් "ශ්‍රී ලංකාව විදේශීය සෘජු ආයෝජන සඳහා ආකර්ශනීය ස්ථානයක්ද?" යන තේමාව යටතේ 2018 පෙබරවාරි 22 සහ 24 යන දෙදින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ "සංශ්‍රවණ" ශාලාවේදී පවත්වන ලද අතර හතරවැනි දේශනය "සජීවී සංවිධානථ සුවිශේෂී ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා සංවිධාන වෙනසකට ලක්කිරීම" යන තේමාව යටතේ 2018 ජුනි 25 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ "සංවදනී" ශාලාවේදී පැවැත්වුණි. එය පවත්වන ලද්දේ බීජිං විදේශ අධ්‍යයන විශ්වවිද්‍යාලයේ උප සභාපති මහාචාර්ය Guohua Yan විසිනි. දේශනය අතරතුර පැවති සාකච්ඡා තුළින් එයට සහභාගී වූ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් වෙත මහත් ප්‍රතිලාභ සැලසිණි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ බීජිං විදේශ අධ්‍යයන විශ්වවිද්‍යාලය අතර දැනුම, කුසලතා පුහුණුව සහ පර්යේෂණ හුවමාරුව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා 2018 මාර්තු 14 වන දින බීජිං විදේශ අධ්‍යයන විශ්වවිද්‍යාලයේ මහාචාර්ය හා උප සභාපති ආචාර්ය Jia Wenjian ප්‍රධාන කොටගත් එම විශ්වවිද්‍යාලයේ ඉහළ මට්ටමේ ශාස්ත්‍රඥයින්ගෙන් සමන්විත නියෝජිත පිරිසක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසලට පැමිණියහ. එම නියෝජිත පිරිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් දීප ව්‍යාප්ත සේවා සඳහා පවත්වනු ලබන ධාරිතා සංවර්ධන වැඩසටහන් සමග සම්බන්ධ වීමට වඩාත් උනන්දුවක් දැක්වූ අතර රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහනට ඒකාබද්ධ ඉගැන්වීම් කටයුතු මගින් සම්බන්ධ වීම පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කිරීමට එකඟ වූහ. මහාචාර්ය හා උප සභාපති ආචාර්ය Jia Wenjian, උපාධි පාසලේ මහාචාර්ය හා විධායක උප සභාපති ආචාර්ය Tao Jiajun, කොන්ෆියුසියස් ආයතන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, මහාචාර්ය He Jing සහ ආසියානු සහ අප්‍රිකානු අධ්‍යයන අංශයේ පීඨාධිපති මහාචාර්ය Ma ද මෙම නියෝජිත පිරිසට ඇතුළත් විය.

පශ්චාත් උපාධි අධ්‍යයන පාසලේ අනාගත සංවර්ධන කටයුතු සඳහා මූලාරම්භය ගෙන ඇති අතර එහි වැඩසටහන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ රාමුව හා අනුකූල වේ. ඒ අනුව වැඩසටහන් සහ මොඩියුලවල අන්තර්ගතය අඛණ්ඩව සංශෝධනය වන බව සහතික කෙරේ.

08. 2018 වසර තුළ පවත්වන ලද විභාග

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශය මගින් 2018 වසර තුළදී විභාග 120 ක් පවත්වා ඇති අතර ඉන් විභාග 78 ක් බාහිර ආයතන සඳහා ද ඉතිරිය අභ්‍යන්තර වැඩසටහන් සඳහා ද පවත්වා තිබේ.

බාහිර විභාගවලට ප්‍රධාන වශයෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අභ්‍යන්තර උසස්වීම් සඳහා වන විභාග ඇතුළත් විය. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පහත සඳහන් බාහිර හා අභ්‍යන්තර විභාග පවත්වනු ලැබ තිබේ. මෙයට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සහාය ඇතිව පවත්වන ලද මාර්ගගත විභාග 14 ක් ඇතුළත් විය.

2018 වසර තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද විභාග සංඛ්‍යාව

අනු අංකය	අංශය	විභාගයේ නම	අපෙක්ෂකයින් සංඛ්‍යාව
1	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ AR I G-II සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	6
2	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ MA 2-2 G-III සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
3	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ MM 1-1 G-II සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
4	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ MA 1-2 G-III සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	4
5	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය	නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ MA 1-2 G-I සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	2
6	වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	වෙරළ සංරක්ෂණ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	7
7	වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	ක්ෂේත්‍ර කම්කරු නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	3
8	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	ප්‍රජා පාදක විශෝධන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	6
9	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	අධීක්ෂකවරුන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	20
10	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	කළමනාකරණ කාණ්ඩයේ (MM-1) පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
11	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ (JM-1) පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	7
12	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	ඵලදායී/මෙහෙයුම්/සනත්ව කාණ්ඩය (MA-5-2) සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	54
13	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	MA (තාක්ෂණික නොවන) කාණ්ඩය (MA-1-2) සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	3

14	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	අධීක්ෂකවරුන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	3
15	සුරාබදු දෙපාර්තමේන්තුව	සුරාබදු දෙපාර්තමේන්තුවේ ස්ථාන භාර සුරාබදු නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	15
16	සුරාබදු දෙපාර්තමේන්තුව	සුරාබදු දෙපාර්තමේන්තුවේ ස්ථාන භාර සුරාබදු නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	19
17	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	ධීවර අධීක්ෂකවරුන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	12
18	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ඒ තාක්ෂණික නොවන II ශ්‍රේණිය (MA-1-2) සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	14
19	ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	නීති නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
20	ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව	නීති නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	2
21	ධීවර හා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව	III ශ්‍රේණියේ සහකාර කොමසාරිස්වරුන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	2
22	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	මුද්‍රණ සේවයේ III ශ්‍රේණියේ විධායක නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
23	ආගමන විගමන දෙපාර්තමේන්තුව	ප්‍රතීතන නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	3
24	ආගමන විගමන දෙපාර්තමේන්තුව	සහකාර පාලක සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	4
25	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	සංවර්ධන සහකාර නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	127
26	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	දෙපාර්තමේන්තු ලිපිකරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	73
27	ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව	ස්ථාන භාර නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
28	ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව	තාක්ෂණික සහකාරවරුන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	11
29	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	III ශ්‍රේණියේ කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	5
30	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	I ශ්‍රේණියේ 2 පන්තියේ කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	3
31	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	II ශ්‍රේණියේ තත්ව පාලකවරුන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
32	ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව	ලිපිකරු III සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	5
33	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	මූල්‍ය නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
34	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	2
35	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	MA සහ DMA සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	20

36	ආරක්ෂක අමාත්‍යාංශය	සහකාර පාලක (පුපුරන ද්‍රව්‍ය) සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	2
37	ආරක්ෂක අමාත්‍යාංශය	රාජ්‍ය බුද්ධි සේවයේ 2 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	9
38	කඳුරට නව ගම්මානල යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය	රාජ්‍ය ප්‍රජා පහසුකම් සලසන්නන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	4
39	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	තාක්ෂණ සහකාරවරුන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	28
40	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	සංවර්ධන සම්බන්ධීකාරක සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	9
41	ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	නීති නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
42	මහවැලි හා පරිසර අමාත්‍යාංශය	නීති නිලධාරී සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
43	මහවැලි හා පරිසර අමාත්‍යාංශය	පරිසර කළමනාකරණ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	8
44	මහ නගර අමාත්‍යාංශය	නීති නිලධාරී සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
45	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ 1 පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	13
46	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ 1 පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	29
47	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ 1 පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග	69
48	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ 1 පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	29
49	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ 3 පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	69
50	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ 3 පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	7
51	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ 2 පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	10
52	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ 2 පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	7
53	ක්‍රීඩා අමාත්‍යාංශය	නීති නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
54	ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය	බුද්ධිමය දේපළ සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	6
55	ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා විමර්ශන) සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1

56	ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය	ලිපිලේඛන හා දත්ත සහකාරවරුන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
57	ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා විමර්ශන) සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
58	ජාතික විද්‍යා පදනම	විද්‍යාත්මක නිලධාරී (AR-1 II ශ්‍රේණිය) සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	6
59	ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය	කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	6
60	ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය	වැඩිහිටි අයිතීන් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	12
61	NSB	සහකාර කළමනාකරු තනතුර උසස් කිරීම	183
62	අමාත්‍ය මණ්ඩල කාර්යාලය	ප්‍රගති සහකාර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
63	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	ධීවර අධීක්ෂක සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	12
64	අමාත්‍ය මණ්ඩල කාර්යාලය	විධායක නිලධාරී කාණ්ඩයේ II පන්තියේ (SL 1-2016) නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය II (SL 1-2016)	1
65	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
66	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය	කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (සහන සොයුරි)	33
67	විද්‍යාල තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා මහනුවර උරුමය පිළිබඳ අමාත්‍යාංශය	ක්ෂේත්‍ර සේවාවේ කථිකාචාර්ය තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය	1
68	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවාවේ III පන්තියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	11
69	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 017 (II)	138
70	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (II)	42
71	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2017 (II)	27
72	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2017 (II)	10
73	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2017 (II)	2
74	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2018 (I)	174
75	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2018 (I)	56
76	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2018 (I)	21

77	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
78	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	II ශ්‍රේණියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (2018)	179
79	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන සඳහා වන විභාගය	104
80	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ගිණුම් නිලධාරී / මූල්‍ය නිලධාරී තනතුරු සඳහා අභ්‍යන්තර බඳවාගැනීම්	3
81	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ගබඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ I කණ්ඩායම සඳහා නැවත පවත්වන විභාගය	30
82	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	MPM 2015 - 2017 සමාසිකය V	58
83	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	SDE 2018 2 වන බඳවාගැනීම් මට්ටම (III)	49
84	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	SDE 2018 2 වන බඳවාගැනීම් මට්ටම (II)	64
85	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන සඳහා වන විභාගය	104
86	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන සඳහා වන විභාගය 2017 (විවෘත) - නැවත පවත්වන විභාගය	104
87	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන සඳහා වන විභාගය - 2018	29
88	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවාරම්භක විභාගය	29
89	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	කළමනාකරණ සහකාර තනතුරට බඳවාගැනීම සඳහා වන ලිඛිත තරඟ විභාගය - 2018	1208
90	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	CEEP (අදාළ මට්ටමට තෝරාගැනීම) 2018 1 වන බඳවාගැනීම	38
91	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	CEEP (අදාළ මට්ටමට තෝරාගැනීම) 2018 2 වන බඳවාගැනීම	16
92	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	CEEP (අදාළ මට්ටමට තෝරාගැනීම) 2018 2 වන බඳවාගැනීම	95
93	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවාරම්භක විභාගය 2014 (1 වන හා 2 වන කණ්ඩායම්) නැවත පවත්වන විභාගය	6
94	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	MPM 2016 - 2018 III සමාසිකය	89
95	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන සඳහා වන විභාගය - 2019	27
96	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන සඳහා වන විභාගය	20
97	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	DIPPCA (WD)	33

98	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	HN-DIPPCA	41
99	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	HN-DIPPCA සමාසිකය (II) WE	41
100	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	DIPPCA II සමාසිකය	53
101	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	MPM 2017- 2019 I සමාසිකය	63
102	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	SDE 2017 1වන බඳවාගැනීම (III මට්ටම)	39
103	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	SDE 2017 1 වන බඳවාගැනීම (III මට්ටම)	64
104	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	MPM 2015 - 2017 VI සමාසිකය	62
105	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	MA තනතුර සඳහා බඳවාගැනීමේ විභාගය (පරිගනක ප්‍රායෝගික)	90
106	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	MPM නැවත පවත්වන විභාගය	5
107	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	තොරතුරු තාක්ෂණ DEMO සහ විශ්ලේෂක තනතුර සඳහා අභ්‍යන්තර බඳවාගැනීම	3
108	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	MPM නැවත පවත්වන විභාගය	6
109	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	SDE 2017 3 වන බඳවාගැනීම (II uÜgu)	92
110	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	28
111	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව	92
112	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	28
113	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ගබඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	36
114	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	DIPPCA & DIPPCA (WD) 2017/2018	33
115	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	HN DIPPCA 2017/2018	41
116	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව 2018 2 වන බඳවා ගැනීම I මට්ටම	73
117	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	CEEP 1 වන බඳවාගැනීම I මට්ටම	22
118	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	SLIDA සහතික ලත් කළමනාකරණ සහකාර ඩිප්ලෝමා පාඨමාලාව	287
119	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	SLIDA සහතික ලත් KKS ඩිප්ලෝමා පාඨමාලාව	6
120	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	SLIDA සහතික ලත් රියදුරු ඩිප්ලෝමා පාඨමාලාව (ප්‍රායෝගික පරීක්ෂණය)	37

09. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානයේ අරමුණ වනුයේ පුහුණු හා උපදේශන සේවා තුළින් තම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හැකියාවන් සංවර්ධනය කරගැනීම සඳහා රාජ්‍ය අංශයේ සංවිධානවලට සහාය වීමයි. මෙම මධ්‍යස්ථානය මගින් පවත්වන ලද සියලු පුහුණු පාඨමාලා සහ සපයන ලද උපදේශන සේවා සියල්ල මගින් මෙම අරමුණ සපුරා ගැනීම ඉලක්ක කෙරිණි.

තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව යනු අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ විශේෂ වැඩසටහන් අතරින් එකකි. අනෙකුත් වැඩසටහන් අතර SLIDA පරිගනක ධාවන බලපත්‍රය (SLIDA Computer Driving Licenses) විශේෂයෙන්ම වැදගත් විය. එම වැඩසටහන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රාදේශීය දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයන්හිදී පවත්වන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 3 ශ්‍රේණියේ ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා ඊ- රජය සහ ආරක්ෂාව පිළිබඳ මාර්ගගත මොඩියුල ලබාදීම ආරම්භ කරන ලදී. එමගින් එයට සහභාගි වන පිරිසට ඔවුන්ගේ රාජකාරි කටයුතුවලට බාධා නොවන පරිදි පාඨමාලාවේ නියමිත කාලසීමාව තුළදී ඕනෑම ස්ථානයක සිට ඕනෑම වේලාවකදී අධ්‍යයන කටයුතු කිරීමේ පහසුව සැලසේ.

මෙම වසර තුළදී, මධ්‍යස්ථානය විසින් එහි කාර්ය මාලාවට ඇතුළත් ධාරිතා සංවර්ධන සහ සේවාරම්භක පුහුණු වැඩසටහන් විසි දෙකක් පවත්වන ලදී. ඒවායේ විස්තර 01 හා 02 වගු මගින් දැක්වේ. මෙම කාලපරිච්ඡේදය තුළදී රාජ්‍ය අංශයේ නිලධාරීන් වෙත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නව ප්‍රවණතා හඳුන්වාදීම සඳහා මධ්‍යස්ථානය විසින් එක් විශේෂ වැඩමුළුවක් පවත්වන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව මෙම වැඩසටහන පැවැත්වීය. මෙයට අමතරව, මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග ඒකකය සමග සහයෝගීත්වයෙන් මාර්ගගත විභාග නවයක් ද පවත්වන ලදී. එහි විස්තර 03 වගුව මගින් දැක්වේ. "රාජ්‍ය අංශය සඳහා නවීන තාක්ෂණය පිළිබඳ දැනුවත්භාවය" යන තේමාව යටතේ මධ්‍යස්ථානය විසින් විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සමග සහයෝගීත්වයෙන් 2018 වසරේදී විශේෂ වැඩමුළු / සංසද ද්විත්වයක් සංවිධානය කරන ලදී. එහි විස්තර 04 වගුව මගින් දැක්වේ.

මෙම කාල පරිච්ඡේදය තුළදී විවිධ සංවිධාන සඳහා පරිගණක විද්‍යාගාර කුලියට සැපයීම මගින් මෙම මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සඳහා රුපියල් 1,381,500.00 ක මුදලක් උපයා දී ඇත. එහි විස්තර 05 වන වගුවේ දැක්වේ.

අභ්‍යන්තර ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාඨමාලා කළමනාකරණ පද්ධති සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධති මෘදුකාංගය තවදුරටත් වැඩි දියුණු කර තිබේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දත්ත මධ්‍යස්ථානය තුළ නව සර්වර් දෙකක් සවි කිරීම මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර ජාලය සහ එහි දෘඩාංග යටිතල පහසුකම් ද මෙම කාලපරිච්ඡේදය තුළදී වැඩි දියුණු කරන ලදී. අනුවාද සටිටන මගහරිමින් යෙදුම් ස්ථාපනය කිරීම සඳහා අතත්‍ය සර්වර් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මෙම සර්වර් භාවිතා කෙරේ. මෙම පද්ධතිය මගින් ආයතනයේ අභ්‍යන්තර සහ බාහිර සේවාලාභීන් වෙත බිඳිය නොහැකි අඛණ්ඩ සේවාවක් සැපයේ. නව සර්වර් සඳහා අවකාශය සැපයීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සර්වර් කුටිය පුළුල් කිරීමද මෙම වසරේදී සිදු කෙරිණි.

MS Office 2016 බලපත්‍ර 250 ක් සහ MS Project 2016 බලපත්‍ර 30 ක් මිලදීගැනීම මගින් පුහුණු සහ දත්ත සැකසුම සඳහා මෘදුකාංග භාවිතය නීත්‍යානුකූල කිරීම වනාහී තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සංවර්ධනයේ තවත් වැදගත් පියවරකි. මෙම මිලදී ගැනීම් සඳහා අරමුදල් සපයන ලද්දේ පිළිවෙලින් රජය සහ USAID ව්‍යාපෘතියයි.

මෙම මධ්‍යස්ථානයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය ශක්තිමත් කරමින් එහි ප්‍රදර්ශක තනතුරේ පුරප්පාඩුව ජයමාලි ගෝමස් මෙය පත් කිරීම මගින් පුරවන ලද අතර මෙම කාලපරිච්ඡේදය තුළදී තොරතුරු තාක්ෂණ සහාය උපදේශක මනෝජ් පෙරේරා මහතා දකුණු කොරියාවේ සොවුල් ජාතික විශ්වවිද්‍යාලයේ දෙවසරක පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ගොස් තිබේ.

සේවාරම්භක සහ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන්

අංකය	වැඩසටහනේ නම	දින ගණන	ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	සහභාගීත්ව දින ගණන
1	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන 2018/19	3	1	1	209	627
1.1	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන 2018/19 – A කණ්ඩායම	17	1	1	39	663
1.2	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන 2018/19 – B කණ්ඩායම	17	1	1	33	561
1.3	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන 2018/19 – C කණ්ඩායම	17	1	1	38	646
1.4	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන 2018/19 –D කණ්ඩායම	17	1	1	37	629
1.5	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන 2018/19 –E කණ්ඩායම	17	1	1	41	697
2	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 3 ශ්‍රේණිය 2010 සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන – B - රජය පිළිබඳ මොඩියුලය (මාර්ගගත පාඨමාලාව)	5	5	5	208	1040
3	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 3 ශ්‍රේණිය 2009 සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන – B - රජය පිළිබඳ මොඩියුලය (මාර්ගගත පාඨමාලාව)	5	2	2	96	480
4	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් (1 පන්තිය) සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන – B - රජය පිළිබඳ මොඩියුලය	4	1	1	25	600
	එකතුව	102	14	14	726	5943

නියමිත පුහුණු වැඩසටහන්

අංකය	සංවිධානයේ නම සහ වැඩසටහනේ නම	දින ගණන	ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	සහභාගීත්ව දින ගණන
1	තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	26	1	1	20	520
2	Advanced Excel (01 වන කණ්ඩායම)	3	3	3	67	210
3	MS Access හි දත්ත පද්ධති කළමනාකරණය	3	3	3	47	141
4	ඊ - රජය සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ ජංගම පුහුණු වැඩසටහන - මඩකළපුව	1	2	2	160	960
5	රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව (2017/2019) - III වන සමාසිකයල ඊ - රජය පිළිබඳ මොඩියුලය - සතියේ දින	5	2	2	79	198
6	රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත්තු පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2017/2018 – උසස් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ මොඩියුලය	12	2	1	54	972
7	කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	4	1	1	30	720
8	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම පිළිබඳ එහි කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව	1	1	1	10	60
9	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පාඨමාලා කළමනාකරණ පද්ධතිය පිළිබඳ විශේෂ පරිගනක පුහුණුව	2	1	1	22	264
එකතුව		57	16	15	489	4045

මාර්ගගත විභාග

අංකය	මධ්‍යස්ථානය	විභාග සංඛ්‍යාව	අපේක්ෂකයින් සංඛ්‍යාව
1	හම්බන්තොට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	2	95
2	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන 2018/19- A කණ්ඩායම	1	37
3	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 3 ශ්‍රේණියේ 2010 කණ්ඩායම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	5	208
4	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 3 ශ්‍රේණියේ 2009 කණ්ඩායම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	2	96
5	කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	1	40
6	SLIDA සහතික ලත් කළමනාකරණ සහකාර උසස් ඩිප්ලෝමා පාඨමාලාව - තොරතුරු තාක්ෂණය පිළිබඳ මොඩියුලය	2	156
එකතුව		13	632

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සමග සහයෝගීත්වයෙන් පවත්වන ලද විශේෂ වැඩමුළු / සංසඳ

අංකය	මාතෘකාව	සම්පත් දායකයාගේ නම	සහභාගී වූ සංඛ්‍යාව
1	“Google භාවිතයෙන් සංඛ්‍යාංකනය කිරීම තුළින් වැඩ පහසු කරගන්නා ආකාරය”	Mr. Clehan Pulle	113
2	CXO සංසදය	Mr. Calvin Hindle	80
එකතුව			193

2018 වසර තුළදී පරිගණක විද්‍යාගාරය වෙන්කිරීම පිළිබඳ දත්ත

අංකය	ආයතනයේ නම	දින ගණන	ලැබූ මුදල රුපියල් වලින්
1	සුළු පරිමාණ ව්‍යාපාර සංවර්ධන අංශය, යෞවන කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය	8	623,350.00
2	මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)	2	137,000.00
3	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	1	75,000.00
4	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	3	244,650.00
5	Search for Common Grounds (SFCG)	1	55,000.00
6	ලෝක සෞඛ්‍ය සංවිධානය	1	110,000.00
7	විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය	3	136,500.00
එකතුව		19	1,381,500.00

10. භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය

භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය විසින් කළමනාකරණ මට්ටමේ නිලධාරීන් සඳහා ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාවක් ද කළමනාකරණ නොවන මට්ටමේ නිලධාරීන් සඳහා ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාවක්ද පිරිනමනු ලබයි. මෙම පාඨමාලා නිර්මාණය කෙරී ඇත්තේ තම ආයතන තුළ ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා එම නිලධාරීන්ට අවශ්‍ය වන ඉංග්‍රීසි භාෂා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහායි. 2018 වසරේදී 88 දෙනෙකු සඳහා ඩිප්ලෝමා පාඨමාලා දෙකක් පවත්වන ලද අතර සහතික පත්‍ර පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව 165 කි.






ඉහත වැඩසටහන් දෙකට අමතරවල දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණිය සහ I වන ශ්‍රේණිය සඳහා සඳහා කථන ශිල්ප පුහුණු වැඩසටහන් 06 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන මගින් ඉලක්ක කරන ලද්දේ එයට සහභාගී වන පිරිසගේ මහජන ආමන්ත්‍රණ කුසලතා, පෞරුෂත්වය සහ නායකත්ව කුසලතා වැඩි දියුණු කිරීමයි.




11. පොදු පරිපාලනය

11.1 මානව සම්පත් කළමනාකරණය

11.1.1. පහත සඳහන් තනතුරු පුරප්පාඩු ද්විතීය පදනමින් සම්පූර්ණ කර ඇත

1.	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01
2.	ජ්‍යෙෂ්ඨ උපදේශක	02
3.	අධ්‍යක්ෂ (මූල්‍ය)	01
4.	කළමනාකරණ සහකාර	02
5.	කාර්යාල සහායක	04

ඉහත තනතුරුවලට අමතරව කාර්යාල සහායක තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරියෙකු බඳවා ගෙන ඇත.

11.1.2. පහත තනතුරු නිලධාරීන් විශ්‍රාම යෑම, ඉල්ලා අස්වීම සහ ද්විතීය කාලපරිච්ඡේදය අවසන් වීම යනාදිය හේතුවෙන් පුරප්පාඩු විය

1.	අධ්‍යක්ෂ ජනරාල්	01
2.	ජ්‍යෙෂ්ඨ උපදේශක	02
3.	උපදේශක	01
4.	සහකාර අධ්‍යක්ෂ (විභාග)	01
5.	වැඩසටහන් නිලධාරී	02
6.	කළමනාකරණ සහකාර	03
7.	රියදුරු	01
8.	කාර්යාල සහායක	01

11.2. කාර්ය සම්පාදන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ පහත ප්‍රදේශ සකස් කිරීම සිදු කර ඇත.

	ප්‍රසම්පාදන වර්ගය (භාණ්ඩල කාර්යයන්, උපකරණ හා සේවා යනාදිය)	ගෙවන ලද මුදල
1	ප්‍රධාන ගොඩනැගිල්ලේ තෙවන මහල සහ වහලය අලුත්වැඩියා කිරීම	6,164,264.50
2	ප්‍රධාන ගොඩනැගිල්ලේ 1-1 පන්ති කාමරය අලුත්වැඩියා කිරීම	6,685,388.10
3	ප්‍රධාන ගොඩනැගිල්ලේ 2-1 පන්ති කාමරය අලුත්වැඩියා කිරීම	6,838,825.81
4	දේශන ශාලාව යළි සකස් කිරීම (Cyber Café)	10,530,517.82
5	පුස්තකාලය අලුත්වැඩියා කිරීම	230,000.00
6	උද්‍යානයේ භූමි අලංකරණය සහ නඩත්තුව	311,148.25
7	Microsoft Office බලපත්‍රය සැපයීම සහ ස්ථාපනය	2,530,695.75
8	පුස්තකාලයේ පද්ධති අධි ශ්‍රේණිකරණය	410,000.00
9	ගෘහභාණ්ඩ මිලදීගැනීම	423,768.13
10	කාර්යාල උපකරණ (ලැප්ටොප් පරිගණක - 23 සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර)	3,711,000.00
11	විදුලි උපකරණ (වායු සමීකරණ යන්ත්‍ර, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර (Multimedia Projectors), ඡායා පිටපත් යන්ත්‍ර, PA පද්ධති, CCTV කැමරා යනාදිය)	2,367,700.00
12	UNDP සර්වරය සැපයීම සහ ස්ථාපනය	1,127,500.00
13	SPS සඳහා ලිපිගොනු ගබඩා කිරීමේ කබඩ්ස් සැපයීම සහ සවි කිරීම	128,445.25
14	RFID දොරවල් පද්ධතිය සැපයීම සහ සවි කිරීම	477,000.00
15	ලේඛනාගාරය සඳහා වානේ රාක්ක සැපයීම සහ සවි කිරීම (2 වන අදියර)	178,500.00
16	පොත් සහ ඊ - ද්‍රව්‍ය මිලදී ගැනීම	961,130.43
17	තොරතුරු තාක්ෂණ අංශය පිළිසකර කිරීම	114,783.00
18	ෆයිබර් කේබල් සවි කිරීම	510,521.95
19	ප්‍රධාන ගොඩනැගිල්ල පුළුල් කිරීමේ කටයුතු අවසන් කිරීම	1,557,469.47
	එකතුව	45,258,658.46

12. 2018 වසරේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විශේෂ අවස්ථා

01. "ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හරිත යුගයක් කරා ගමන් කරයි"

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තුළ හරිත බලශක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත් මූලාරම්භයන් කිහිපයක් සැලකිල්ලට ගෙන ජර්මානු තානාපති කාර්යාලය සහ GIZ විසින් 2017 වසරේදී "හරිත බලශක්ති ශූරතාව" එම ආයතනය වෙත ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාවට අතිගරු ජනාධිපති, රාජ්‍ය පරිපාලන කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු නලින් පී. ජයමහ මහතා සහභාගී වූහ. මෙම අවස්ථාවට පැමිණ සිටි අනෙකුත් උසස් නිලධාරීන් අතර ශ්‍රී ලංකාවේ ජර්මානු ෆෙඩරල් ජනරජ තානාපති අති ගරු Jorn Rodhe හා GIZ නියෝජිත Daniel Schreiber මහතා, අමාත්‍යාංශ ලේකම්වරු, යුධ හමුදාපති, නාවික හමුදා හා පොලිස් මාණ්ඩලික ප්‍රධානී යන අය වූහ.

රජයේ හරිත බලශක්ති ප්‍රතිපත්තිය ඵලදායී අන්දමින් ක්‍රියාවට නැංවීම සහතික කරමින් අතිගරු ජනාධිපතිතුමන් විසින් සූර්ය බලශක්ති පද්ධතිය, ජීව වායු උත්පාදන ඒකකය හා කොම්පෝස්ට් නිෂ්පාදන ඒකකය සහ බලශක්ති අධීක්ෂණ හා පරිසර අධීක්ෂණ ඒකකය විවෘත කරන ලදී.

ජාතික පරිසර ප්‍රතිපත්තිය හා අනුගතව අවශ්‍ය තාක්ෂණික සහාය සහ මගපෙන්වීම සැපයීම මගින් රාජ්‍ය අංශයේ අනෙකුත් සංවිධාන අතර බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ හා නිසි පරිදි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ පද්ධතිය පිළිබඳ සංකල්පය ප්‍රවර්ධනය කිරීමේ ආදර්ශ ආයතනයක් වශයෙන් හරිත බලශක්තිය ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය බලාපොරොත්තු වේ.





02. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පරිසර සම්මානය 2018 දිනා ඇත

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය විසින් 2018 වසර සඳහා සංවිධානය කරන ලද පරිසර සම්මාන උළෙලේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ආයතන කාණ්ඩය යටතේ පරිසර සම්මානය - 2018 දිනා ගන්නා ලදී.

මෙම පරිසර සම්මාන උළෙලේ ප්‍රධාන අරමුණ වනුයේ රට තුළ තිරසර සංවර්ධනයක් ඇති කරලීමට තුඩු දෙන අන්දමින් ශ්‍රී ලාංකීය ආයතන විසින් පාරිසරික අධ්‍යාපනය, කළමනාකරණය, ධාරිතා සංවර්ධනය, පර්යේෂණ හා දැනුම හුවමාරුව සම්බන්ධයෙන් දරනු ලබන ප්‍රයත්නයන් හඳුනාගැනීම අගය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමයි.

සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල 2018 දෙසැම්බර් 2 වන දින බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.





03. දූපත් රාජ්‍යයන්හි රාජ්‍ය පරිපාලන ධාරිතාවන් ශක්තිමත් කිරීම පිළිබඳ වෘත්තික සංසදය

එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සාමාජීය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් දූපත් රාජ්‍යයන්හි රාජ්‍ය පරිපාලන ධාරිතාවන් ශක්තිමත් කිරීම යන තේමාව යටතේ සංවිධානය කරන ලද වෘත්තික සංසදය 2018 අගෝස්තු 20 සිට 24 දක්වා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී පවත්වන ලදී.

මෙම සංසදය මගින් අරමුණු කෙරෙනුයේ දූපත් රාජ්‍යයන්ට 2030 න්‍යාය පත්‍රය තම සැලසුම්, ප්‍රතිපත්ති හා උපායමාර්ගයන් තුළට ඒකාබද්ධ කර ගත හැකි ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීමයි. දූපත් රාජ්‍යයන්හි රාජ්‍ය පරිපාලන ධාරිතා ශක්තිමත් කරමින් රාජ්‍ය ආයතන සන්නද්ධ කළ හැකි හොඳම ආකාරය සහ තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී හවුල්කාරිත්වයක් ගොඩ නගන ආකාරය පිළිබඳ එහිදී විශේෂ අවධානය යොමු කෙරේ. මෙම සංසදයට විවිධ සංවර්ධනය වෙමින් පවතින දූපත් රාජ්‍ය වෙතින් 30 දෙනෙක් සහභාගි වූහ.

පාර්ලිමේන්තුවේ අධීක්ෂණ මන්ත්‍රී සහ තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍ය නියෝජිත ගරු සන්දිත් සමරසිංහ, එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක, ටෙරන්ස් ජෝන්ස් මහතා, පාලනය පිළිබඳ ප්‍රධාන ව්‍යාපෘති කාර්යාලය Division, UN DESA, Chae Gun Chung මහතා, එක්සත් ජාතීන්ගේ ආපදා අඩු කිරීමේ ජාත්‍යන්තර ක්‍රමෝපාය - ආසියා පැසිෆික් කලාපයේ නියෝජ්‍ය ප්‍රධානී අනිමේෂ් කුමාර් මහතා තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ආචාර්ය සුගත් යාලේගම සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වසන්තා පෙරේරා මහත්මිය යන මහත්ම මහත්මීහු මෙහි සමාරම්භක සැසියට සහභාගී වූහ.





04. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්

ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනය සමග සහයෝගීත්වයෙන් ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 2018 අගෝස්තු 31 හා සැප්තැම්බර් 1 යන දෙදින පළමු කණ්ඩායම සඳහාත් 2018 සැප්තැම්බර් 14 හා 15 යන දෙදින 2 වන කණ්ඩායම සඳහාත් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නව ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මෙම නිලධාරීහු බස්නාහිර, වයඹ, මධ්‍යම, ඌව, දකුණු සහ සබරගමුව යන පළාත් සභා හය නියෝජනය කරමින් පැමිණියහ.

ශ්‍රී ලංකාවේ ගැටුම්වලින් බලපෑමට ලක්වූ ප්‍රදේශයන්හි ඉදිරි පෙළ නිලධාරීන් පුහුණුකිරීම සඳහා වන ව්‍යාපෘතිය (FORWARD ව්‍යාපෘතිය) යටතේ සකස් කරන ලද විස්තීර්ණ පුහුණු මොඩියුල භාවිතයෙන් ඉදිරි පෙළ නිලධාරීන් පුහුණු කිරීමේ දින දහයේ වැඩසටහන් පුහුණු වී පැවැත්වීම සඳහා පහසුකම් සලසන්නන් / පුහුණුකරුවන් වශයෙන් කටයුතු කිරීම සඳහා කණ්ඩායම් දෙකෙන්ම ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් 48 දෙනෙක් පුහුණු කරන ලදී.

FORWARD ව්‍යාපෘතිය උතුරු, නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල සාර්ථක අන්දමින් සම්පූර්ණ කරන ලදී.





05. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද විධායක සංවර්ධන වැඩමුළුව : "සියල් සපිරි ශ්‍රී ලංකාවක්, රාජ්‍ය අංශයේ ප්‍රමුඛයින්ගේ කාර්යභාරය"

"සියල් සපිරි ශ්‍රී ලංකාවක් - රාජ්‍ය අංශයේ ප්‍රමුඛයින්ගේ කාර්යභාරය" යන තේමාව යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද සිවු දින විධායක සංවර්ධන වැඩමුළුව 2018 ජූලි 3 වන දින සිට 6 වන දින දක්වා පැවැත්විණි. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා අවසානයේදී උපකාරී වන උපායමාර්ගික හා ක්‍රමානුකූල චින්තනය පුළුල් කරගැනීම සඳහා දැනුම ලබාගැනීම මගින් අවශ්‍ය නිපුණතාවන් නිලධාරීන් විසින් තමන් තුළ වර්ධනය කරගනු ලැබීම වැඩමුළුවේ ඉලක්කය විය. මෙම වැඩමුළුවට කීර්තිමත් රාජ්‍ය නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ අමාත්‍යාංශ උපදේශකයින් සහ අධ්‍යාපනඥයින් පිරිසක් සම්පත් දායකයින් මෙන්ම මණ්ඩල සාමාජිකයින් වශයෙන් සහභාගී වූහ.

USAID මගින් අරමුදල් ලබන ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ සහයෝගය ලද මෙම වැඩමුළුවල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වසන්තා පෙරේරා මහත්මියගේ නායකත්වය යටතේ පානදුර, Jie Jie Beach by Jetwing හෝටලයේදී පැවැත්විණි.



- **දෙවන විධායක සංවර්ධන වැඩමුළුව : "සපිරි ශ්‍රී ලංකාවක් - රාජ්‍ය අංශයේ ප්‍රමුඛයින්ගේ කාර්යභාරය"**

"සියල් සපිරි ශ්‍රී ලංකාවක් - රාජ්‍ය අංශයේ ප්‍රමුඛයින්ගේ කාර්යභාරය" යන තේමාව යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද සිවු දින විධායක සංවර්ධන වැඩමුළුව දෙවන වතාවටත් 2018 අගෝස්තු 14 සිට 17 දක්වා පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා අවසානයේදී උපකාරී වන උපායමාර්ගික හා ක්‍රමානුකූල චින්තනය පුළුල් කරගැනීම සඳහා දැනුම ලබාගැනීම මගින් අවශ්‍ය නිපුණතාවන් නිලධාරීන් විසින් තමන් තුළ වර්ධනය කරගැනීම මෙම වැඩමුළුවේ ඉලක්කය විය. කීර්තිමත් රාජ්‍ය නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයින් පිරිසක් සම්පත් දායකයින් මෙන්ම මණ්ඩල සාමාජිකයින් වශයෙන් මෙම වැඩමුළුවට සහභාගි වූහ. USAID මගින් අරමුදල් සම්පාදනය කෙරෙන, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ ආධාරය ලද මෙම වැඩමුළුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජෙනරාල් වසන්තා පෙරේරා මහත්මියගේ නායකත්වය යටතේ වයික්කාල Club Hotel Dolphin හිදී පවත්වන ලදී. හෝටලයේදී පැවැත්විණි.





06. පොලිස් ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් රාජ්‍ය පරිපාලන සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව පොලිස් ප්‍රතිසංස්කරණ පිළිබඳ ශ්‍රී ලංකා පොලීසියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් හා නියෝජ්‍ය පොලිස්පතිවරුන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය 2018 මැයි 11 දින සාර්ථක අන්දමින් පවත්වන ලදී.

රාජ්‍ය පරිපාලන සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ සහ අමාත්‍යාංශ ලේකම් පද්මසිරි ජයමාන්න මහතාගේ හා පොලිස්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් මෙම සම්මන්ත්‍රණය පැවැත්වුණි. සම්මන්ත්‍රණයට සහභාගී වූ පිරිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිල වශයෙන් පිළිගන්නා ලද අතර පොලිස් ප්‍රතිසංස්කරණ පිළිබඳ යෝජිත ක්‍රියාකාරී සැලැස්ම මෙම සැසි වාරය තුළදී ගැඹුරින් සාකච්ඡාවට බඳුන් කරන ලදී. ප්‍රතිසංස්කරණ මෙහෙයුම් කමිටුව, ජාතික පොලිස් කොමිෂන් සභා සාමාජිකයෝ සහ අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු මෙම අවස්ථාවට සහභාගී වූහ.

07. **ඉන්දීය රජයේ සිවිල් සේවකයින් සඳහා මූල්‍ය කළමනාකරණය සහ විගණනය පිළිබඳ පුහුණු වැඩසටහන (NIFM)**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉන්දීය රජයේ අභ්‍යන්තර විගණකයින් සඳහා මූල්‍ය කළමනාකරණය සහ විගණන මූලාරම්භයන් පිළිබඳ පුහුණු වැඩසටහනක් 2018 මැයි 13 සිට 19 දක්වා සාර්ථක අන්දමින් පවත්වන ලදී. විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු නියෝජනය කරමින් තිස් දෙනෙක් මෙයට සහභාගී වුණු අතර අභ්‍යන්තර විගණනය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව විසින් යොදාගනු ලබන භාවිතයන් සහ දෙරටෙහි අත්දැකීම් හුවමාරු කරගැනීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.



08. **දීප ව්‍යාප්ත සේවාවන්හි 1 පන්තියේ නිලධාරීන් සඳහා Toastmasters International මගින් කථන ශිල්පය පිළිබඳ පුහුණුව**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය Toastmasters International සමග එක්ව ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා කථන ශිල්පය පුහුණු කිරීමේ වැඩසටහන් වට කිහිපයක් සාර්ථක අන්දමින් පවත්වා තිබේ. එම වැඩසටහන සම්පූර්ණ කළ නිලධාරීන් වෙත ඔවුන්ගේ සහතික පත් ප්‍රදානය කරන ලදී.



09. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හරිත සතිය

"රජයේ පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතා ජාලකරණ ව්‍යාපෘතිය" සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් එහි හරිත මූලාරම්භයන් ප්‍රවර්ධනය කිරීම සඳහා 2018 මාර්තු 26 සිට 29 දක්වා හරිත සතියක් ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හරිත සතියේ සමාරම්භක උළෙල, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් ජේ.ජේ. රත්නසිරි, විදුලි හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්, බී.එම්.එස්. බටගොඩ, අතිගරු ජර්මානු තානාපති John Rohde යන මහත්වරුන් සහ රජයේ හා පුද්ගලික අංශයේ තවත් නියෝජිතයින් කිහිප දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව පවත්වන ලදී.





10. කඩල දන්සැල

වෙසක් සැමරුමට සමගාමීව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පරිශ්‍රය බෞද්ධ කොඩිවලින් සරසන ලද අතර වෙසක් කූඩු දල්වා ඒකාලෝක කරන ලදී. එයට අමතරව 2018 මැයි 30 වන දින සවස් කාලයේ බෞද්ධාලෝක මාවතේ ටොරින්ටන් වෙසක් කලාපය නැරඹීමට පැමිණි සැදැහැවතුන් වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සුභසාධක සංගමයේ සාමාජිකයින් විසින් කඩල දන්සැලක් පවත්වන ලදී.





11. රාජ්‍ය කළමනාකරණ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ 2017 - 2019 කණ්ඩායමේ සමාරම්භක උත්සවය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල විසින් එහි රාජ්‍ය කළමනාකරණ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2017 - 2019 සඳහා අපේක්ෂකයින් 89 දෙනෙකු බඳවා ගන්නා ලදී. එහි සමාරම්භක උත්සවය 2018 පෙබරවාරි මාසයේදී පැවැත්වුණු අතර රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා ප්‍රධාන අමුත්තා වශයෙන් එයට සහභාගී වුණි.






12. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සංවිධානය කරන ලද ප්‍රසිද්ධ දේශන මාලාව

ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල විධායක නිලධාරීන්ගේ කළමනාකරණ ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල විසින් දේශන මාලාවක් සංවිධානය කර තිබේ. එහි 2018 වසරේ හතරවන දේශනය "සජීවී සංවිධාන, සුවිශේෂී ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා සංවිධාන වෙනසකට ලක්කිරීම" යන මාතෘකාව යටතේ 2018 ජූනි 25 වන දින එම ආයතනයේ සන්වදනී ශාලාවේදී පවත්වන ලදී. එම දේශනය බීජිං විදේශ අධ්‍යයන විශ්වවිද්‍යාලයේ උප සභාපති මහාචාර්ය Guohua Yan විසින් පවත්වන ලදී. එයට සහභාගී වූ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීහු මෙම දේශනය තුළදී පැවති සාකච්ඡාව වෙතින් ප්‍රතිලාභ ලැබූහ.





13. **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඩිජිටල් ඇකඩමිය සඳහා පළමු පියවර වශයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මාර්ගගත සහතික පත්‍ර පාඨමාලාව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් දියත් කරන ලදී.**



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් තුමියගේ අවසන් නිල උත්සවය වශයෙන් එහි මෘදුකාංග දියත්කිරීම මෙම කර්තව්‍යය සඳහා ඇගේ පුරෝගාමීත්වය වෙත ගෞරවය පුද කරමින් පැවැත්වීමේ මහඟු අවස්ථාව අප වෙත ලැබුණි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන	2018	2017
වත්කම්		රු.ශ	රු.ශ
ජංගම වත්කම්			
බැංකු ශේෂය	03	72,042,623.13	4,051,951.91
තැන්පත් නොකළ ලැබීම්		525,555.04	120,376.50
ත්‍රෛමාසික ඉතුරුම්	04	290,170,307.53	268,046,188.01
ණයගැතියෝ	05	29,937,094.12	36,800,695.54
අතැති තොගය	06	4,518,286.49	3,097,579.47
පෙර ගෙවුම්	07	3,429,902.43	4,931,816.97
අත්තිකාරම්	08	1,940,973.56	5,715,120.34
සේවක ණය	09	15,432,939.82	15,036,793.34
		417,997,682.12	337,800,522.08
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	10	26,777,965.38	412,427,321.74
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	11	34,776,276.63	31,591,567.42
තැන්පතු ගිණුම්	12	1,299,500.00	1,299,500.00
		62,853,742.01	445,318,389.16
මුළු වත්කම්		480,851,424.13	783,118,911.24
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවියයුතු තැන්පත්	13	50,845,178.00	23,151,896.28
අත්තිකාරම් ලැබීම්	14	93,686,228.51	79,421,201.83
උපචිත වියදම්	15	25.431.601.95	19,985,653.00
අඩමාන ණය සඳහා වෙන්කිරීම්		3,669,302.08	3,221,450.00
		173,632,310.54	125,780,201.11
ජංගම නොවන වගකීම්			
දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	16	23,170,823.72	24,825,882.55
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	17	29,614,322.20	28,994,006.20
		52,785,145.92	53,819,888.75
මුළු වගකීම්		226,417,456.46	179,600,089.86
ශුද්ධ වත්කම්		254,433,967,.67	603,518,821.38
ශුද්ධ වත්කම්/හිමිකම්			
විලම්බිත ආදායම් - භාණ්ඩාගාර ප්‍රදාන		595,232,238.83	514,054,873.20
වෙනත් සංචිත-වත්කම් ප්‍රත්‍යාගණන සංචිත	18	12,015,807.00	12,015,807.00
සමුච්චිත අතිරික්තය හෝ ඌනතාවය	19	52,081,705.58	77,448,141.18
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		659,329,751.41	603,518,821.38

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	සටහන	2018	2017
ආදායම		රු. ශ	රු. ශ
භාණ්ඩාගාර දායකත්වය	20	133,612,634.37	134,878,953.61
අනෙක් ආදායම්			
පාඨමාලා ගාස්තු	21	1,571,500.00	4,802,662.00
ශාලා කුලියට ගැනීම්	18	553,241.50	6,370,175.00
ප්‍රකාශන අලෙවිය		434,654.50	618,280.00
ආයෝජන මත ආදායම්	22	31,856,460.09	31,944,464.48
ණය පොලී		667,962.13	626,400.73
කුලී	23	16,413,920.17	8,522,121.13
බදු කුලී		1,655,058.83	1,655,058.33
පරිත්‍යාග (එජාසංඅ)			3,871,700.36
පශ්චාත් උපාධි අධ්‍යයන පාසල		17,487,414.44	20,679,500.02
භාෂා වැඩසටහන		10,875,500.00	7,104,450.00
උපදේශන සේවා	24	33,805,397.26	137,482,019.51
ආයතන කොටස් ආදායම		16,782,713.75	
සුළු ආදායම	25	18,631,860.87	4,142,770.91
මුළු ආදායම්		302,348,317.86	362,698,546.08
වියදම්			
පුද්ගල පඩිනඩි	26	100,923,950.47	87,053,813.18
කාර්ය මණ්ඩල සුභසාධනය	27	3,869,863.80	4,794,399.71
ගමන් වියදම් උපවේෂණ දීමනා සහ දීමනා	28	4,393,844.63	9,260,683.06
පොදු සහ අනෙක් සේවා	29	36,630,134.29	35,393,023.40
ප්‍රවාහන	30	3,913,840.52	4,847,841.41
ස්ථාවර වත්කම් අළුත්වැඩියා සහ නඩත්තුව	31	5,459,151.92	7,517,313.15
සැපයුම් සහ අවශ්‍යතා	32	9,493,108.15	10,910,556.37
මූල්‍ය ගාස්තු	33	3,609,058.04	4,383,941.00
පුස්තකාල සේවා	34	431,271.50	364,945.00
පුහුණු සහ ඇගයුම්	35	1,756,600.85	7,743,538.45
ප්‍රකාශන සහ තොරතුරු සේවා	36		208,054.00
විදෙස් පුහුණු සහ අධ්‍යයන චාරිකා	36 a	59,111,650.38	46,413,155.28
ක්ෂය	37	39,720,093.64	37,148,051.70
පශ්චාත් උපාධි අධ්‍යයන පාසල	38	7,793,566.08	5,630,763.15
ඉංග්‍රීසි වැඩ සටහන	39	3,916,965.00	2,859,500.00
උපදේශක සේවා	40	33,805,397.36	65,751,394.79
පාඩු සහ කපා හැරීම්(පුහුණුකරුවන් පුහුණු කිරීම)			11,736,078.22
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		3,223,949.00	2,513,632.70
අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදන		447,852.08	1,476,400.00
ප්‍රකාශන වියදම්		268,498.50	650,808.00
මුළු වියදම්		318,768,796.21	346,657,892.57
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය)		(16,420,478.35)	16,040,653.51

13. විගණන කමිටුවේ වාර්තාව

අංක PED 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධි විධානයන්ට අනුව, විගණන කමිටුව, එම කමිටුවේ සභාපතීත්වය දරන භාණ්ඩාගාර නියෝජිතවරයා ඇතුළුව ස්වාධීන විධායක නොවන පාලක සභා සාමාජිකයින් සිවු දෙනෙකුගෙන් (4) සමන්විත වේ.

2018 වසර සඳහා පාලක සභාව විසින් පත් කරන ලද විගණන කමිටුමේ සාමාජිකයින් පහත පරිදි වේ:

• පී.බී.එස්.සී. නෝනිස් මහතා	ජනරාල් / කමිටුවේ සභාපති කොමිප්‍රෝලර් ජෙනරාල් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය
• එස්.ටී. කොඩිකාර	ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (පාලක සභා රැස්වීමේදී 08.06.2018 දින සිට පත් කරන ලද)
• කමල් පත්මසිරි මහතා	ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
• කේ.ඩී.ඩී.කේ ද ආබෘ මහතා	පාලක සභා සාමාජික (22.05.2018 දින සිට ඉල්ලා අස් වී ඇත)
• ඩී.ඒ.වී. මහේන්ද්‍ර රත්නසේකර	පාලක සභා සාමාජික

රැස්වීම

2018 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වර්ෂය සඳහා කමිටුවේ ලේකම් වශයෙන් අභ්‍යන්තර විගණක කටයුතු කළේය. එම වසර තුළ විගණන කමිටු රැස්වීම් 3 ක් පැවැත්වුණු අතර විගණන කමිටු රැස්වීම් වාර්තා සභාව වෙත නිතිපතා යොමු කරන ලදී. රජයේ සිදු වූ වෙනස්කම් හේතුවෙන් 04 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම නොපවත්වන ලද අතර ආයතනය සඳහා මණ්ඩල සාමාජිකයින් නම් නොකරන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු වන විගණන අධිකාරී එම්.ආර්.ආර්.කේ. මල්ලව මෙයට නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී විය. එයට අමතරව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට නිරීක්ෂයෙකු වශයෙන් සහභාගී විය. විශේෂ කාරණාවලදී විගණන කමිටුව වෙත උපදෙස් ලබාදීම සඳහා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත ආරාධනා කෙරිණි.

2018 මූල්‍ය වර්ෂය තුළ අවස්ථා තුනකදී විගණන කමිටුව රැස් වුණ අතර ඔවුන්ගේ පැමිණීම පහත පරිදි වේ.

නම	2017		
	මාර්තු 19	ජූලි 04	සැප්තැම්බර් 26
පී.බී.එස්.සී. නෝනිස් මහතා	√	√	√
එස්.ටී. කොඩිකාර මහතා (පාලක සභා රැස්වීමේදී 08.06.2018 දින සිට පත් කරන ලදී)	-	√	√
කමල් පත්මසිරි මහතා	√	-	√
කේ.ඩී.ඩී.කේ. ද ආබෘ මහතා (22.05.2018 දින සිට ඉල්ලා අස් වී ඇත)	√	-	-
ඩී.ඒ. විජිත් මහේන්ද්‍ර රත්නසේකර	-	-	-

මෙහෙවර සහ කාර්යභාරය

කමිටුවේ සමුද්දේශ විෂයය, අංක PED 55 හා 2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව නිර්වචනය කෙරේ. මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අභ්‍යන්තර හා බාහිර විගණන යනාදිය පිළිබඳ පාලක සභාවේ පොදු දැක්මෙහි අරමුණු ඉටු කිරීමට කමිටුව සහාය වේ.

සමුද්දේශ විෂය

අංක PED 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පාලක සභා සාමාජිකයින් විසින් ඉදිරිපත් කර ඇති නියත සමුද්දේශ විෂයය මගින් කමිටුව පාලනය වේ. සමුද්දේශ විෂයය සහ රජයේ අවශ්‍යතාවලට අනුකූලව තම වගකීම් ඉටු කිරීමේදී පහත අරමුණු කෙරෙහි කමිටුව අවධානය යොමු කරයි.

අ. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිර්ණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය

ආ. අස්තිත්වයේ සියලු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධතීන් සමාලෝචනය සහ ඇගයුම

ඇ. පිරිවැය ඵලදායිතාව සඳහා සහ නාස්තිකාර වියදම් ඉවත් කිරීම යනාදිය සඳහා නියත කාල අන්තරවලදී කාර්යසාධනය සමාලෝචනය කිරීම

ඈ. බාහිර විගණකයින් සමග සම්බන්ධීකරණය ඇති කරගැනීම සහ විගණකාධිපතිගේ /බාහිර විගණකයින්ගේ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් පසු විපරම සිදු කිරීම

ඉ. ව්‍යවස්ථා, රෙගුලාසි, නීති සහ චක්‍රලේඛ අනුකූල වන බව නිශ්චය කිරීම

ඊ. ගිණුම්කරණ ප්‍රමිති හා අනුගත වන්නේ ද යන්න සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

උ. අභ්‍යන්තර විගණන/ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කොට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම

ඌ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම

එ. කමිටුව විසින් සැලකිල්ලට ගත යුතු, ක්‍රියාවට නැංවිය යුතු හෝ වැඩි දියුණු කළ යුතු දැ වශයෙන් හඳුනාගනු ලැබූ ඕනෑම කාරණයක් පාලක සභාව වෙත වාර්තා කිරීම

ඒ. වාර්ෂික වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයාගැනීම් පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම

මූල්‍ය වාර්තාකරණය

පාර්ශ්වකරුවන් වෙත සැපයෙන තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ ඵලදායී බව කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. ගිණුම් පොත් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා පාලක සභාව සතු වන වගකීම ඉටු කිරීමට කමිටුව පාලක සභාවට සහාය වෙයි. සියලු ගණුදෙනු නිවැරදිව හා සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල වාර්තා වන බවට සාධාරණ සහතිකයක් සැපයීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ ක්‍රියා පටිපාටීන්වල ප්‍රමාණවත් බව සහ ඵලදායී බව කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

කමිටුව විසින් සියලුම ත්‍රෛමාසික විගණනය නොකළ අතුරු මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන සමග මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදු කරන ලද වැදගත් උපකල්පන හා විනිශ්චයන් ඇතුළත් වූ උපකාරක තොරතුරු සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර පාලන

විගණන කමිටුව විසින් 2017 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය වාර්තාකරණයේදී අභ්‍යන්තර පාලනයේ ඇති ඵලදායී බව තක්සේරු කරන ලදී. මෙම ක්‍රියාවලිය මගින් අභ්‍යන්තර පාලන කටයුතුවල සහ නීති හා රෙගුලාසි සමග අනුගත වීම සහතික කිරීම සඳහා පවතින අවදානම් පාලනය කිරීමේ ක්‍රියාවලිවල ප්‍රමාණවත් බව සහ ඵලදායී බව තක්සේරු කරනු ලබයි. අභ්‍යන්තර විගණකයින් විසින් ලබාදෙන නිර්දේශ මත පදනම්ව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ඵලදායී බව වැඩි දියුණු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව කමිටුව සහතික කරයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම මගින් පාලක සභාව වෙත එහි කාර්යයන් අඛණ්ඩව සිදු කිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා හැකියාව ලබාදේ.

අභ්‍යන්තර විගණනය

විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වල අභ්‍යන්තර විගණන කටයුතු ස්වාධීනව සිදු කෙරෙන බවත් අපක්ෂපාතීව හා නිසි වෘත්තීමය අයුරින් සිදු එය සිදු කෙරෙන බවත් විගණන කමිටුව සහතික කරයි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, වපසරිය සහ ඵලදායී බව විගණන කමිටුව විසින් අධීක්ෂණය හා සමාලෝචනය කරන ලදී.

පී.බී.එස්.සී. නෝනිස්
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. EHA/C/FS/SLIDA/03/2018/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2019 මැයි 29 දින

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

i. ප්‍රමිත අංක 02 හි 09 ඡේදයට අනුකූලව අත රඳවා ගෙන තිබුණු තැන්පත් නොකළ ලැබීම් රු.525,555 ක් මුදල් හා මුදල් සමාන දෑ ශේෂයෙහි නොදක්වා කාරක ප්‍රාග්ධන වෙනස්වීමක් ලෙස දක්වා තිබුණි.

ii. ප්‍රමිත අංක 07 හි 14 ඡේදය අනුව වත්කම ගිණුම්ගත කිරීම එහි පිරිවැය හෝ ධාරණ අගය විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විය යුතු නමුත් කොන්ත්‍රාත් හතරක වටිනාකම රු. 15,228,514 ක් ඉංජිනේරු නිර්දේශය පමණක් පදනම් කරගෙන ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

i. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් 2015 වර්ෂයේදී ලබා දී තිබූ රු.8,158,986 ක මුදලින්, දරනු නොලැබූ ඉතිරි මුදල වියදම් රු.1,036,804 ක් අදාළ ආයතනයට ආපසු නොගෙවා ප්‍රවර්තන වර්ෂයේ දී ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

ii. පශ්වාත් උපාධි අංශය හා භාෂා අංශය වෙත ලැබිය යුතු ලෙස දක්වා තිබුණු රු.12,195,650 ක් විධිමත් අනුමැතියකින් තොරව ගිණුම්වලින් කපාහැර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 779,612,380 ක් වූ නමුත් විස්තරාත්මක උපලේඛනය අනුව එය රු.786,743,302 ක් විය. ඒ අනුව රු.7,130,922 ක වෙනසක් නිරීක්ෂණය විය

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාවාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති, විධිවිධානවලට යොමුව	**විස්තරය**
	---	---
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය	විධිවිධාන ප්‍රකාරව ආයතනයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමග විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2017 අංක 24 දරන ආදායම් බදු පනත	උපයන විට ගෙවිය යුතු බදු ඉපයූ මාසයට පසු මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු නමුත්, සමාලෝචිත වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා අඩුකර ගෙන තිබූ රු.596,023ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.
(ඇ)	ආයතන සංග්‍රහය XV පරිච්ඡේදය 10.4 වගන්තිය හා 10.8 වගන්තිය	විදේශගත වීම සඳහා දින 10 කට පෙර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගතයුතු වුවත් නිලධාරීන් දෙදෙනෙකුගේ විදේශ ගමන් සඳහා අනුමැතිය දී ලබා දී නොතිබියදී ඔවුන් විදේශගත වී තිබුණි.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

i.	2015 මැයි 05 දිනැති අංක 01/2015/01 දරන චක්‍රලේඛය	විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් නවාතැන් සඳහා පමණක් පහසුකම් සපයන අවස්ථාවක ආහාරපාන සඳහා සංයුක්ත දීමනාවෙන් සියයට 35 ක් පමණක් ගෙවිය යුතුයි. එසේ වුවද එයට අනුකූල නොවන ලෙස ආයතනයේ නිලධාරීන් 11 දෙනෙකු සඳහා සහ වෙනත් ආයතනවල නිලධාරීන් 166 ක් සඳහා රු. 4,115,324 ක් (ඇ.ඩොලර් 23,788) වැඩිපුර ගෙවා තිබුණි.
ii.	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරණ චක්‍රලේඛය	අතුරු අග්‍රිමයන් අදාළ කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 19 කදී පාඨමාලා ගාස්තු හා වියදම් සඳහා ලබාගත් රු. 794,405 ක් වූ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමේදී දින 10 සිට දින 209 දක්වා කාල ප්‍රමාදයන් පවතින බව දක්නට ලැබුණි.
iii.	2003 ඔක්තෝබර් 28 දිනැති අංක PED/17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	නිලධාරීන් විදේශගත වීමට ප්‍රථම රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂක ජනරාල්ගෙන් අනුමැතිය ලබා ගත යුතු නමුත් නියැදි පරීක්ෂාව අනුව අවස්ථා 15 කදී නිලධාරීන් 224 ක ගේ විදේශ ගමන් සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	වටිනාකම රු.56,743,886 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන අනුව ලේඛනයක් පවත්වා ගැනීම හෝ සකස්කර ඇති ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඊ) 2003 ජූනි 02 දිනැති
අංක PED/12 දරන රාජ්‍ය
ව්‍යාපාර වක්‍රලේඛය

i.	5.2.4 වගන්තිය	කෙටුම්පත් අයවැය මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර පාලක මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුමත කර තිබුණේ 2018 ජනවාරි 19 දින දී ය.
ii.	6.5.3 වගන්තිය	වාර්ෂික වාර්තා මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු නමුත් 2017 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව විගණිත දිනය දක්වා සභාගත කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	**නිරීක්ෂණ**
1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිහිටුවීමේ පනතේ දක්වා ඇති අරමුණු අනුව ආයතනය විසින් ක්‍රියාකාරකම් සිදු කිරීම	ආයතනයේ අරමුණක් හෝ කාර්යභාරයක් නොවන සහ ආයතනයේ පුහුණු වැඩ සටහන්වලට අදාළ නොවන කාර්යක්ෂමතා කඩඉම් විභාග 78ක් ප්‍රවර්තන වර්ෂය තුලදී පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

කළමනාකරණ ක්‍රියාකාරකම්

2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ද්විතීයන අධ්‍යයන කාර්යමණ්ඩලය වෙත සියයට 50 ක ද්විතීයන දීමනාවක් ගෙවා තිබුණු අතර, 2014 නොවැම්බර් 14 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා නියෝග අනුව එම ගෙවීම සඳහා මාසිකව ඉටුකල යුතු අවම පැය ප්‍රමාණය පැය 45 ක් බව දක්වා තිබුණි. මේ අනුව,

- මාසික පැය 45 සීමාව වෙත ලභා නොවුණු දේශකයින්ගේ අඩු පැය ප්‍රමාණය සඳහා වූ අයකිරීම් සිදුකළ නොහැකි වීම හේතුවෙන් ආයතනය වෙත 2018 වර්ෂයේ මුල් මාස 06 තුළ රු. 1,433,300 ක ආදායම් අහිමි වී තිබුණි.

- ශ්‍රී ලංකා පරිපාලන සේවය වෙත 2017 වසරේදී විවෘත පදනම මත බඳවා ගන්නා ලද නිලධාරීන් 104 දෙනෙකු සඳහා වන සේවාරම්භක පුහුණු පාඨමාලාව සඳහා කාර්ය ඇස්තමේන්තු සැකසීමේදී බාහිර දේශකවරුන්ගේ දේශන පැය 2,034 ක් සහ අභ්‍යන්තර දේශකවරුන්ගේ දේශන පැය 1,854 ක් ඇතුළත්ව දේශන පැය 3,888 සඳහා සැලසුම් සකස් කර තිබුණි. එසේ වුවද සත්‍ය වශයෙන් අභ්‍යන්තර දේශන පැය 1,080 ක් ද එනම් සියයට 58 ක් පමණක් හා බාහිර දේශන පැය 1,650 එනම් සියයට 81 ක් පවත්වා තිබීම හේතුවෙන් කාර්යය ඉටු කිරීමේදී බාහිර දේශකවරුන්ට ප්‍රමුඛතාව ලබාදී තිබුණු බැවින් අභ්‍යන්තර දේශකවරුන්ගේ දායකත්වය පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (2014/2016) විවෘත පදනම මත බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා වන සේවාරම්භක පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධව අමාත්‍යාංශය සමග ඇතිවූ එකඟතාවයේදී ආයතනික කාර්යමණ්ඩලයේ දායකත්වය (දේශන ගාස්තු) හා ආයතනික ගාස්තු අය නොකර පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවද, පුහුණුවන්නන් සඳහා පැවැත් වූ මොඩියුල විභාග පැවැත්වීම වෙනුවෙන් රු.1,387,390 ක් අයකරගෙන තිබුණු අතර, ඉන් ආයතනික නිලධාරීන්ට රු. 960,245 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න

විගණකාධිපති